# 2022 ඔක්තෝම්බර් මස මාසික සභා රැස්වීමේ සංශිප්ත වාර්තාව

## තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව

**ස්ථානය - තිස්සමහාරාම ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාව**
**දිනය - 2022.10.18**
**වේලාව - පෙ.ව. 10.00**

**පැමිණීම -**

| | | |
|---|---|---|
| I. | ඩබ්ලිව්.ජී. උපුල් මහතා | - ගරු සභාපති |
| II. | විදාන ගමගේ සුදත් මහතා | - ගරු උප සභාපති |
| III. | ඩබ්.කේ. ටෂිත සමිල මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | හර්ෂ උදය කුමාර ජයවීර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඒ.පී. ධම්මික මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ආර්.රජිත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VII. | චතුමිණි විජේනායක මෙනවිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VIII. | ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IX. | ආර්.කේ.එම්. රෝහිත මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| X. | පී.කේ. ආරියසේන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XI. | එන්.ජී. සරත් මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XII. | වයි.කේ. වසන්ත ප්‍රියදර්ශන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIII. | චමින්ද ඩයස් වන්නිගේ මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XIV. | ජී.එච්.ජී. නීටා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XV. | වැල්ලගේ ජීවානි මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVI. | ඒ.ඩබ්. නන්දා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| XVII. | පී.එල්. වාලි ගුණරත්න මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

**නොපැමිණීම -**

| | | |
|---|---|---|
| I. | කේ.එච්. ගාමිණී මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| II. | එල්.එච්. කුමුදු සුජීව මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| III. | එම්.එල්.එම්. හනීෆා මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| IV. | කපිල ඉන්ද්‍රජිත් ශ්‍රීවර්ධන මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| V. | ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය | - ගරු ප්‍රාදේශීය සභා සභික |
| VI. | ඩබ්.කේ. සිසිර කුමාර මහතා | - ගරු ප්‍රාදේශීය සභා සභික |

ප්‍රථමයෙන්ම සියලුම දෙනා පංචසීලය සමාදන් වීමෙන් අනතුරුව, රට වෙනුවෙන් දිවිපිදූ විරෝධාර රණවිරුවන්ට, ප්‍රාදේශීය සභාවේ ධූර කාලය දරා, මේ වන විට මිය ගොස් ඇති බුද්ධදාස ජයසූරිය මහතා ඇතුළු ගරු සභාපතිවරුන්ට, ගරු උප සභාපති ලෙස සිට මිය ගොස් ඇති ඩබ්.කේ. ප්‍රේමදාස මහතා හා අප සභාව නියෝජනය කළ ගරු සභික, එච්.ජේ.කේ.ජී. විජේරාම මහතාත්, ගරු සභිකවරුන් ඇතුළුව මියගිය සියලුම දෙනාට උපහාර දක්වමින්, විනාඩි දෙකක නිෂ්ශබ්දතාවය පළ කරන ලදී.

ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් 2022 වර්ෂයේ ඔක්තෝම්බර් මස මහා සභා රැස්වීම සඳහා පැමිණ සිටින ගරු උප සභාපති, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්, ලේකම්තුමිය හා මාධ්‍යවේදී ප්‍රේමදාස මහතා ඇතුළු පිරිස පිළිගනිමින් න්‍යාය පත්‍රානුකූලව සභා කටයුතු ආරම්භ කරන ලදී.

**(අ) (i) 2022.09.16 වන දින පවත්වන ලද මහා සභා රැස්වීමේ වාර්තාව සම්මත කිරීම.**

2022.09.16 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන ලෙස ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා යෝජනා කරන ලදී. 2022.09.16 දිනැති මහා සභා වාර්තාව සංශෝධනයන්ට යටත්ව සම්මත කරන බව ගරු ප්‍රාදේශීය සභා සභික ඩබ්.කේ. ටෂිත සමිල මහතා යෝජනා කළ අතර, ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

**(ආ) ගරු සභාපතිවරයා විසින් කරනු ලබන නිවේදනය -**

I. ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා, එල්.එච්. කුමුදු සුජීව මහතා එවා ඇති නිවාඩු ලිපි නිවේදනය කරන ලදී.

ගරු සභික, එල්.එච්. කුමුදු සුජීව මහතා අද දින ද මහා සභාව සඳහා නිවාඩු ලිපියක් යොමු කර තිබුණද, ඔහු මීට පෙරත් දිගින් දිගටම මහා සභාවට කිසිදු දැනුම් දීමකින් තොරව නොපැමිණ ඇති නිසාත්, ඇතැම් අවස්ථාවල නිවාඩු ලිපි වැරදි අත්සනකින් යුතුව ඉදිරිපත් කර සභාව නොමග යැවීමට කටයුතු සිදු කර ඇති නිසාත්, ඔහුගේ නිවාඩු ලිපිය මහා සභාව විසින් අනුමත කළ නොහැකි බවත්, මේ සම්බන්ධයෙන් නීති උපදෙස් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමිය මගින් පළාත් පාලන කොමසාරිස්තුමා වෙත යොමු කර ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට කටයුතු කරන ලදී.

එසේම, ගරු ප්‍රාදේශීය සභා සභික, කේ.එච්. ගාමිණී මහතා විසින් එවා ඇති නිවාඩු ලිපිය මහා සභාව විසින් අනුමත කරන බව දන්වා සිටින ලදී.

II. (1) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) IV (ආ) වැනි කොටස පළාත් පාලනය - පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ ඇති දැන්වීම ප්‍රකාරව, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන විජේනායක කෝරලේ කංකානම්ගේ ශාන්තිලතා මහත්මිය එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඇයගේ සභික ධූරය ඇය විසින් අතහැර ඇති බව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රවීන්ද්‍ර සුභාෂණ වෙදනගේ මහතා යන අය විසින් (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10අ(1)(ආ) වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කර ඇති බව සියලුම දෙනාගේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

(2) එසේම ඉහත කී ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ (අති විශේෂ) IV (ආ) වැනි කොටස - පළාත් පාලනය - පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10අ(1)(අ) වගන්තිය යටතේ ඇති දැන්වීම ප්‍රකාරව, තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ සභිකයෙකු වන මොහම්මද් ලාහිරීන් මොහම්මද් හනීෆා මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා එම සභාවේ ඔහුගේ සභික ධූරය ඔහු විසින් අතහැර ඇති බව තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ තේරීම්භාර නිලධාරී රවීන්ද්‍ර සුභාෂණ වෙදනගේ මහතා යන අය විසින් (262 වැනි අධිකාරය වූ) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥා පනතේ 10අ(1)(ආ)

වැනි වගන්තිය යටතේ ප්‍රකාශ කර ඇති බව සියලුම දෙනාගේ දැන ගැනීම සඳහා ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කර සිටින ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

මීට පෙර එක්සත් ජාතික පක්ෂයේ මහ ලේකම් විසින් ලිපියක් මගින් තිස්සමහාරාම ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි විජේනායක කෝරලේ කංකානම්ගේ ශාන්තිලතා මහත්මිගේ සහ මොහම්මද් ලාහිරින් මොහම්මද් හනිෆා මහතා එක්සත් ජාතික පක්ෂ සාමාජිකත්වය අහෝසි කොට පක්ෂයෙන් නෙරපා හැරීමට කටයුතු කර ඇති බව දැන්වීමෙන් පසුව, අප විසින් මහා සභාවට කැඳවීම් සිදු නොකලද, මෙම ගරු සභිකයින් විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත ඒ සම්බන්ධයෙන් දන්වා ඇති නිසා අදාළ ගරු සභිකයින් මහා සභාවට කැඳවන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් දැන්වීමත් සමඟ නැවත මෙම ගරු සභිකයින් දෙදෙනා මහා සභාවට කැඳවීමට කටයුතු කරන ලදී.

කරුණු එසේ සිදු වී තිබියදී, අති විශේෂ ගැසට් පත්‍රයක් මගින් ගරු සභික ඩබ්.කේ.කේ. ශාන්තිලතා මහත්මිය සහ එම්.එල්.එම්. හනිෆා මහතා එක්සත් ජාතික පක්ෂයේ සාමාජිකයෙකුව සිටීම අවසන් කර ඇති නිසා සභාවේ සභික ධූරය ඔවුන් විසින් අතහැර ඇති බවට දන්වා ඇති බැවින්, එම ගරු සභිකයින් දෙදෙනා නැවත මහා සභාවට කැඳවිය නොහැකි බවත්, ඔවුන් මීට පෙර මහා සභාවට පැමිණ ඇති මාසයන් සඳහා ගෙවනු ලැබූ දීමනාවන් නැවත අය කර ගැනීමට ද සිදු විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

III. පුස්තකාල සහායිකා එච්.කේ. ශාන්ති මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති අ.පො.ස(සා.පෙළ) විභාග සහතිකය දෝෂ සහිත බව විභාග දෙපාර්තමේන්තුව විසින් දන්වා ඇති බැවින්, දකුණු පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ 2019/06/01 දිනැති 01/2019 චක්‍රලේඛය ප්‍රකාරව පුස්තකාල සහායිකා තනතුරේ විනය බලධාරියා වෙත පුස්තකාල සහායිකා එච්.කේ. ශාන්ති මහත්මියගේ රාජකාරී වැඩ වහාම තහනම් කර මූලික විමර්ශනයක් සිදු කර ඉදිරි විනය ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරන ලෙසට පළාත් පාලන කොමසාරිස්ගේ අංක 04/03/01 හා 2022.10.17 දිනැති ලිපිය මගින් දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

මෙකී ගැටළුව වර්ෂ ගණනාවක සිට පැමිණෙන දෙයකි. පුස්තකාල සහායිකා එච්.කේ. ශාන්ති මහත්මියගේ විභාග ප්‍රතිඵල සනාථ කිරීම සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත මීට වර්ෂ ගණනාවකට පෙර යවා තිබුණද, එම ප්‍රතිඵල ලේඛනය දෝෂ සහිත නිසා, එකී ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා විභාග දෙපාර්තමේන්තුව වෙත ගොස් ප්‍රකාශයක් ලබා දෙන ලෙස අදාළ ආයතනයන් විසින් කිහිප වරක් දැනුවත් කර තිබුණද, එම අවස්ථා ඇය විසින් මඟ හැර ඇති නිසාත්, විභාග දෙපාර්තමේන්තුව විසින් ඇයගේ අ.පො.ස(සා.පෙළ) විභාග සහතිකය දෝෂ සහිත බවට දන්වා ඇති නිසා රාජකාරී වැඩ වහාම තහනම් කරන ලෙසට දන්වා ඇති බව ප්‍රකාශ කරන ලදී.

පුස්තකාල සහායිකා එච්.කේ. ශාන්ති කොඩිතුවක්කු මහත්මියගේ වැඩ තහනම් කරන ලෙසට පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් අප වෙත දන්වා ඇති බැවින්, එකී කාර්යය අප විසින් සිදු කිරීම කළ යුතුය. නැතහොත් මේ සඳහා අපට වගකීමට සිදු වේ. පවතින මෙම ගැටළුව සම්බන්ධයෙන් ඇය වෙත කිහිප අවස්ථාවක්ම දැනුවත්වීම් සිදු කළද, කිසිදු ක්‍රියාත්මක වීමක් ඇය සිදු කර නොමැත. ව්‍යාජ විභාග සහතික ඉදිරිපත් කර ඇති නිසා ඇය වෙත අද මෙලෙස වැඩ තහනම් වීමක් සිදු වී ඇති බව ප්‍රකාශ කර සිටින ලදී. තවද ඉදිරියේ දී මේ සම්බන්ධයෙන් මූලික විමර්ශණයක් සිදු කිරීමට නියමිත බවද වැඩි දුරටත් දන්වා සිටින ලදී.

එසේම මේ සම්බන්ධයෙන් වැඩි දුර තොරතුරු ගරු සභිකයින් වෙත දැන ගැනීම සඳහා කාරක සභා අවස්ථාවක් පත් කරන ලෙසට දන්වා සිටින ලදී.

✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ ගරු උප සභාපති සුදත් විදානගමගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

කාරක සභා අවස්ථාවේ ලේකම්තුමිය විසින් අදහස් දක්වමින්, පුස්තකාල සහායිකා එච්.කේ. ශාන්ති කොඩිතුවක්කු මහත්මියගේ ආදේශක පත්වීම් කාලයේ සිට මේ දක්වාම පවතින තොරතුරු සියල්ලත්, විභාග දෙපාර්තමේන්තුව වෙතින් අ.පො.ස(සා.පෙළ) ප්‍රතිඵල ලේඛනයේ ගැටළුවක් පවතින බවට දන්වා ඇති ලිපි සියල්ල පිළිබඳවත් ගරු මහා සභාවට ප්‍රකාශ කර සිටින ලදී. මෙම නිලධාරිනියගේ අ.පො.ස. (සා.පෙළ) ප්‍රතිඵල ලේඛනය විභාග දෙපාර්තමේන්තුවේ ලේඛන සමඟ නොසැසඳෙන බවට විභාග දෙපාර්තමේන්තුව මගින් දන්වා ඇති බැවින්, ඒ සම්බන්ධව පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් උපදෙස් පැතීමේදී විනය බලධාරියා ලේකම් වන බැවින්, සේවය අත්හිටුවා විමර්ශනයක් සිදු කරන ලෙස දන්වා ඇත. ඒ අනුව, වහාම ක්‍රියාත්මක වන පරිදි සේවය අත්හිටුවා පරීක්ෂණය අවසන් වන තෙක් පුස්තකාල පරිශ්‍රයට ඇතුළු වීම ද තහනම් කරන ලද බව වැඩි දුරටත් ප්‍රකාශ කර සිටින ලදී.

✓ ගරු සභික, ඒ.පී. ධම්මික මහතාගේ සහ වැල්ලගේ ජීවානි මහත්මියගේ යෝජනා ස්ථිරත්වයෙන් කාරක සභාව නැවත ගරු මහා සභාව බවට පත් විය.

IV. පළාත් පාලන කොමසාරිස්ගේ අංක 3/7/7 හා 2022.09.29 දිනැති ලිපිය මගින් ආහාර සුරක්ෂිතතාවය සහ පෝෂණය සඳහා වැඩසටහන් ක්‍රියාත්මක කිරීම යන මැයෙන් යුතුව එවා ඇති ලිපියේ සඳහන් පරිදි, පෙර පාසල් දරුවන්ගේ පෝෂණය ඉහල නැංවීම සඳහා පහත වැඩසටහන් ක්‍රියාත්මක කරන ලෙසට දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

- උක්ත වැඩසටහනට සමගාමීව මූලික පියවරක් ලෙස දකුණු පළාත් පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක පෙර පාසල් සඳහා පෝෂණීය ආහාරවේලක් ලබා දීම සඳහා කටයුතු සැලසුම් කර ඇති අතර, එම වැඩසටහන සඳහා පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදවා ගනිමින් අදාළ කටයුතු සිදු කිරීම.
- අප ආයතනය යටතේ ක්‍රියාත්මක පෙර පාසල් දරුවන් සඳහා ලෝක ළමා දිනය යෙදෙන ඔක්තෝම්බර් මාසයේ දින 08 ක් (සතියට දින 02 බැගින්) වැඩසටහන ක්‍රියාත්මක කිරීම.
- එකු දරුවකු වෙනුවෙන් දිනකට රු. 60.00 ක පමණ මුදලක් වැය කිරීම සුදුසුය. තම්බන ලද බිත්තරයක්, යෝගට් 01 ක්, තම්බන ලද එළවළු කැබලි, පළාත් ආයුර්වේද දෙපාර්තමේන්තුව විසින් හඳුන්වා දී ඇති කැඳ, නැවුම් එළකිරි, තම්බන ලද ධාන්‍ය, කෙසෙල් වැනි පළතුරක් මුදලේ වටිනාකමට සරිලන පරිදි ලබා දීම සුදුසු වේ.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>ඉහත වැඩසටහනට අනුව, පෙර පාසල් දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම සඳහා පසුගිය සතිය තුළත් ඉදිරි සති තුළත් සභාවට අයත් පෙර පාසල් 06 හි දරුවන් සඳහා බිත්තරයක් සහ කිරි වීදුරුවක් ලබා දීමට තීරණය කරන ලදී. දරුවන් සඳහා ලබා දෙන ආහාර ඉතාමත් පිරිසිදුව ලබා දිය යුතු බැවින්, බිත්තර තැම්බීම සහ කිරි උණු කර ලබා දීම පෙර පාසල තුළදීම දෙමාපියන් විසින් සිදු කිරීමට කටයුතු කරනු ඇත. එසේම මෙලෙසට ලබා දෙන බිත්තර තිස්සමහාරාම ප්‍රදේශයේ ෆාම් එකකින් සහ කිරි ප්‍රදේශයේ ගව හිමියන්ගෙන් ලබා ගැනීමට කටයුතු කර සහා ආදායමින් ගෙවීම් සිදු කරනු ලබයි. තවද, දරුවන්ගේ පෝෂණ තත්ත්වය ඉහල නැංවීම සඳහා මෙම ආහාර ලබා දෙන බැවින්, ඉදිරි දින තුළ ප්‍රෝටීන් බහුල තවත් ආහාර ලබා දීමට ද අදහස් කර ඇති බවත් ප්‍රකාශ කර සිටින ලදී.</u>

## (ඇ) ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සංනිවේදන

I. දෙබරවැව පොදු ක්‍රීඩාංගනය උත්සව, සංගීත සංදර්ශන හා වෙළඳ ප්‍රදර්ශන පැවැත්වීම සම්බන්ධයෙන් තීරණයක් ලබා ගැනීම සඳහා 2022.09.22 වන දින පවත්වන ලද කමිටුව මගින් ලබා ගන්නා ලද පහත තීරණයන් සභා ගත කරන ලදී.

ඉහතින් සඳහන් කරන ලද කමිටුවේ දී පහත තීරණයන් ලබා ගන්නා ලදී.

01. බිම්බදු මුදල හා තැම්පතු මුදල ගැසට් පත්‍රයට අනුව තීරණය කර ඇති බවත්, අය කර ගන්නා විනෝද බදු මුදල විනෝද බදු අඥා පනත අනුව අයකිරීම සිදු කළ යුතු බවද ආදායම් පරීක්ෂක විසින් පෙන්වා දෙන ලදී.

02. වර්ෂයක් සඳහා සැණකෙළි හා උත්සව 03 ක් සඳහා පමණක් ලබා දිම සුදුසු බව යෝජනා විය.

03. තණ තිල්ල සඳහා හානි සිදුව ඇති විට එම හානිය තාක්ෂණික නිලධාරි මගින් තක්සේරු කර එම මුදල අය කර ගත යුතු බවත්, අලුත්වැඩියා සිදු කළ පසු ක්‍රීඩා නිලධාරි මගින් වාර්තාවක් ලබා ගතයුතු බවටද යෝජනා විය.

II. තිස්සමහාරාම බල ප්‍රදේශයේ සිදු කරනු ලබන ඉඩම් අනුබෙදුම් අනුමත කිරීම, ගොඩනැගිලි සංවර්ධන අනුමත කිරීම හා අනුකූලතා සහතික නිකුත් කිරීම සඳහා 2022 වර්ෂයේ සැප්තැම්බර් මස දක්වා සැලසුම් කමිටුවට යොමු කරන ලද සැලසුම්පත් ලේඛන ගරු මහා සාබවට ඉදිරි කර ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

| අනු අංකය | ලි.ප.අ. | නම | අනුමත වීම/නොවීම | කමිටු දිනය |
|---|---|---|---|---|
| 1 | අ/බෙ/2022/82 | උපුල් ක්‍රිෂාන්ත බණ්ඩාර | අනුමත විය | 2022.09.06 |
| 2 | අ/බෙ/2022/54 | ජී.ඒ.සුනිල් ශාන්ත | අනුමත නොවිය | 2022.09.06 |
| 3 | අ/බෙ/2022/80 | ජී.ඒ.ඉෂාන් චතුරංග | අනුමත විය | 2022.09.06 |
| 4 | අ/බෙ/2022/68 | එම්.ඒ.ඥාණවිපුල | අනුමත නොවීය | 2022.09.06 |
| 5 | අ/බෙ/2022/69 | කේ.ඒ.ෂෙනාල් ඩියෝන් | අනුමත නොවිය | 2022.09.06 |
| 6 | අ/බෙ/2022/70 | ඊ.ඒ.චන්ද්‍රදාස | අනුමත විය | 2022.09.06 |
| 7 | අ/බෙ/2022/79 | කේ.ජී,ඒ.අයේෂා ඉදුනිල් | අනුමත විය | 2022.09.06 |
| 8 | අ/බෙ/2022/78 | කේ.ජී.ඒ.අයේෂා ඉදුනිල් | අනුමත විය | 2022.09.06 |
| 9 | අ/බෙ/2022/65 | අරවින්ද අබේදීර | අනුමත නොවිය | 2022.09.06 |
| 10 | අ/බෙ/2022/81 | ගරුසිංහේ රාජරත්න | අනුමත විය | 2022.09.06 |
| 11 | අ/බෙ/2021/105 | ඩී.ඒ.ජනේෂ් ප්‍රියලාල් | අනුමත නොවිය | 2022.09.06 |
| 12 | සං/අ/2022/62 | ඊ.ඒ.චන්ද්‍රදාස | අනුමත විය | 2022.09.06 |
| 13 | සං/අ/2021/101 | ඩී.ඒ.ජේ.ප්‍රියලාල් | අනුමත නොවීය | 2022.09.06 |
| 14 | සං/අ/2021/96 | එච්.සී.අබේවර්ධන | අනුමත විය | 2022.09.06 |
| 15 | සං/අ/2022/65 | අරවින්ද අබේදීර | අනුමත නොවීය | 2022.09.06 |
| 16 | සං/අ/ 2011/85 | එච්.ඊ.ජගත් මාගම්පුර | අනු.ස.අනුමත විය | 2022.09.06 |
| 17 | සං/අ/2022/32 | සංදීප් ජයවර්ධන | අනුමත නොවීය | 2022.09.06 |
| 18 | සං/අ/2021/51 | අයි.එච්.සෝමාවතී | අනුකූ.ස.අනුමත විය | 2022.09.06 |

| | | | | |
|---|---|---|---|---|
| 19 | සං/අ/2022/57 | ඉර්ෂාඩ් අපී | අනු.ස.අනුමත විය | 2022.09.06 |
| 20 | සං/අ/2022/58 | ඉර්ෂාඩ් අලී | අනු.ස.අනුමත විය | 2022.09.06 |
| 21 | සං/අ/2022/44 | එම්.එල්.අනුර සනත්චන්ද්‍ර | අනුමත නොවීය | 2022.09.06 |
| 22 | සං/අ/2022/63 | ඊ.ජ්.චන්ද්‍රදාස | අනුමත විය | 2022.09.06 |
| 23 | අ/බෙ/2022/83 | ජේ.වී.ආර්.පයිවා | අනුමත විය | 2022.09.14 |
| 24 | අ/බෙ/2022/60 | පී.උපුල් දර්ශන | අනුමත විය | 2022.09.14 |
| 25 | අ/බෙ/2022/63 | එන්.එච්.මාලනී | අනුමත විය | 2022.09.14 |
| 26 | අ/බෙ/2022/61 | ඩී.සිරිසේන | අනුමත විය | 2022.09.14 |
| 27 | සං/අ/2022/53 | ජේ.එම්.අර්ජුන අමර ජයසිංහ | අනුමත විය | 2022.09.14 |
| 28 | සං/අ/2022/49 | පී.උපුල් දර්ශන කුමාර | අනුමත විය | 2022.09.14 |
| 29 | සං/අ/2022/43 | පී.උපුල් දර්ශන කුමාර | අනුමත විය | 2022.09.14 |
| 30 | සං/අ/2022/68 | එච්.කේ.අනුපමා ලක්මාලි | අනුමත විය | 2022.09.14 |
| 31 | සං/අ/2022/64 | එම්.ඩී.පී.කුරේ | අනුමත විය | 2022.09.14 |
| 32 | සං/අ/2022/44 | එම්.එල්.අනුර සනත්චන්ද්‍ර | අනුමත වීය | 2022.09.14 |

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>යම් සැලසුමක් සකස් කරන්නේ නම්, ඒ සඳහා ප්‍රාදේශීය සභාවේ සැලසුම් අනුමැතිය සහ ගොඩනැගිලි අනුමැතිය ලබා ගත යුතු බව කොට්ඨාසයන්හි ජනතාව දැනුවත් කරන ලෙස ගරු සභිකයින් වෙත දන්වන ලදී.</u>

III. පළාත් පාලන කොමසාරිස්ගේ අං 02/08/05/03/කර්මාන්ත හා 2022.09.30 දිනැති ලිපිය මගින් රාජ්‍ය වියදම් පාලනය කිරීම - පළාත් පාලන ආයතන අරමුදල් අය මැයෙන් යුතුව පහත සඳහන් තීරණයන් සඳහා එළඹ ඇති බැවින්, ඒ සම්බන්ධයෙන් මහා සභාවේ සියලුම ගරු සභිකයින් දැනුවත් කිරීමට කටයුතු කරන ලෙසටත් දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

(අ) සංවර්ධන ව්‍යාපෘති අනුමත කිරීමේ දී එම ව්‍යාපෘතිවල සමුච්චිත අගය සභාව සතු සම්පූර්ණ අරමුදල් ප්‍රමාණයෙන් 60% නොඉක්මවන පරිදි සභා තීරණ මත කටයුතු කිරීමට එකඟතාවය ලබා දීම.
(ආ) එකී සංවර්ධන ව්‍යාපෘතියේ අත්‍යාවශ්‍යභාවය පිලිබඳව සාධාරණීකරණ වාර්තාවක් මහා සභාවේ දැන ගැනීම සඳහා ප්‍රථමයෙන් ඉදිරිපත් කළ යුතු වේ.
(ඇ) සභාව සතු අරමුදල් ප්‍රමාණයෙන් 60% ක සීමාව නොඉක්මවන ව්‍යාපෘති අනුමැතිය සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය නොවේ.

තවද එකී ලිපිය මගින් මේ සම්බන්ධයෙන් මීට පෙර යොමු කරන ලද අංක 02/08/05/03 හා 2022.06.23 හා 2022.08.16 දිනැති ලිපි මෙයින් අවලංගු කරනු ලබන අතර, උක්ත ලිපියේ පරිදි අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසටත් පළාත් පාලන කොමසාරිස් විසින් එවා ඇති ලිපියේ වැඩි දුරටත් සඳහන් කර ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.

IV. තිස්සමහාරාම, කච්චේරියගම, කණ්ඩියවත්ත, ඉෂාරා ගයාෂාන් මහතා විසින් 2022.10.10 දිනැතිව ලිපියක් මගින්, තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ සහ තිස්සවැව් තාවුල්ල

රථවාහන නැවතුම්පොළ පවතින ගැටළු සම්බන්ධයෙන් කිහිප වරක්ම සභාව දැනුවත් කළද, කිසිදු ක්‍රියාමාර්ගයක් මේ වන තෙක් ලබා දීමට කටයුතු කර නොමැත. මාස 10 කට වැඩි කාලයක් තිස්සේ දුෂ්කර ගැටළු හමුවේ රථවාහන නැවතුම්පොළවල් හි කටයුතු කිරීමට උත්සාහ කළද, එය සාර්ථක නොවූ බැවින්, ඒ සඳහා කඩිනමින් විසඳුම් ලබා නොදෙන්නේ නම්, ඉහත කී රථවාහන නැවතුම්පොළවල් ප්‍රාදේශීය සභාව වෙත පවරා දීමට කටයුතු කරන බව උක්ත ලිපිය මගින් අදාළ බදුකරු විසින් දන්වා ඇති බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා</u>

තිස්ස වැව් කණ්ඩියෙහි බදු අය කිරීමේදී පොලිස් ස්ථාන වෙතින්, ජංගම වෙළඳුන් සහ බෝට්ටු හිමියන් විසින් බාධා කිරීම් ප්‍රශ්න ඇති කිරීම් සිදු කරනු ලබයි. වාහන වලින් බදු අය කිරීමේ දී වන්දනාකරුවන්ට අවශ්‍ය පහසුකම් ලබා නොදෙන බව පවසා වාහනහිමියන් විසින් බදුකරු සමඟ ප්‍රශ්න ඇති කර ගනු ලබයි. මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානය වෙත පැමිණිලි කළ පසුව, එම නිලධාරීන්ද දෝෂාරෝපණ එල්ල කරනු ලබන්නේ බදුකරු වෙතය. වාහන නතර කර තැබීමට ඇති ස්ථානවල ජංගම වෙළඳුන් ජංගම කඩ පවත්වාගෙන යාම නිසා වාහන නතර කිරීමේ පහසුකම් ලබා දීමට නොහැකි වී ඇත. මෙකී ගැටළුකාරී තත්ත්වයන් සමඟ බදුකරු වෙත බදු අය කිරීමට නොහැකි බව මා වෙතද පවසා ඇති බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>තිස්ස වැව් කණ්ඩියෙහි බදු අය කිරීමේ දී අදාළ බදුකරුගේ රාජකාරියට බාධා කිරීම් සහ ඇතැම් ප්‍රශ්න ඇති කරමින් පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් මැදිහත් වීම් කරන බැවින්, මේ සම්බන්ධයෙන් කිහිප අවස්ථාවකම පොලිස් ස්ථානයට දන්වන ලදී. පොලිස් ස්ථානය යනු සාමය කඩවන ස්ථානයක් පවතින්නේ නම් ඊට අදාළ කටයුතු කිරීම මිස, සභාවට ලැබිය යුතු අදායමක් අහිමි කිරීම එම නිලධාරීන්ට නොහැක. මේ සම්බන්ධයෙන් මීට පෙර අවස්ථා කිහිපයකදීම පොලිස් ස්ථානය දැනුවත් කළද, තවමත් සභාවේ කටයුතු සඳහා මැදිහත් වී සභාවට ලැබිය යුතු ආදායම් අහිමි කිරීමට කටයුතු කිරීම කණගාටුවට කරුණකි.</u>

<u>තිස්ස වැව් කණ්ඩියෙහි නතර කරනු ලබන වාහනවලින් බදු අය කිරීමේ දී වාහන අනාරක්ෂිත භාවයක පවතින බව රථවාහන හිමියන් විසින් ප්‍රකාශ කරන්නේ නම්, ඉදිරියේ මුද්‍රණය කරනු ලබන ටිකට්පත්වල වාහන නතර කිරීම සඳහා පමණක් ටිකට් පතක් ලබා දෙන අතර, වාහනවල පවතින බඩු භාහිරාදිය ආරක්ෂා කර ගැනීම වාහන හිමිකරුවන් විසින් සිදු කළ යුතු බවට සඳහන් කිරීම සුදුසු බවත් දන්වා සිටින ලදී.</u>

<u>තිස්ස රථවාහන නැවතුම්පොළ සහ තිස්ස වැව් කණ්ඩියෙහි නඩත්තු කටයුතු පිරිසිදු කිරීම් කටයුතු සිදු කරනු ලබන්නේ අප ආයතන විසින්ය. එම නිසා අප ආයතනයට අයත් දේපළයන්ට අදාළ රාජකාරී කටයුතු කිරීමේ දී ඒ සඳහා කිසිවකුට ප්‍රශ්න ඇති කළ නොහැක. එම නිසා මේ සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරී, ආදායම් පරීක්ෂක ගොස් පරීක්ෂා කර බලා, වාර්තාවක් ලබා ගෙන පොලිස් ස්ථානය, ජංගම වෙළඳුන් සහ බෝට්ටු හිමියන් ගෙන්වා මේ පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කර දීමට සාකච්ඡාවක් ලබා ගැනීම සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.</u>

**(ඇ) යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න -**

**(ඉ) යථා පරිදි කල් දී ඇති යෝජනා**

- <u>**ගරු සභාපති විසින් ඉදිරිපත් කරනු ලැබූ යෝජනා**</u>

01. ජුල්පල්ලම රන්මිණිතැන්න සිහිනි අසපුව යන ස්ථානයට විදුලිය ලබා ගැනීම සඳහා විදුලි බල මණ්ඩලයෙන් පහත සඳහන් ගාස්තු ගෙවීම් කරන ලෙස ලිපියක් මගින් දන්වා ඇති බැවින්, එකී මුදල් ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

- සේවා රැහැන් ඉදිකිරීමේ ගාස්තු - රු. 38,600.00
- ආරක්ෂක ඇප තැන්පත් මුදල - රු. 1,500.00
  (සේවා රැහැනේ දිග මීටර් 60)

- **ගෙවිය යුතු මුදල** **- <u>රු. 40,100.00</u>**

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

02. වරිපනම් බදු තක්සේරු කිරීමට තක්සේරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ උපාධිධාරියෙකු සඳහා දිනකට රු. 2,000.00 ක දීමනාවක් ගෙවීමට සහ එක් දේපළකට රු. 60.00 ක දීමනාවක් ගෙවීම සඳහා අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්,ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>වරිපනම් බදු තක්සේරු කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුවේ අධීක්ෂණය යටතේ උපාධිධාරී නිලධාරියෙකු යෙදීමට කටයුතු කර ඇති බවත්, එමගින් අපගේ දේපළ තක්සේරු කර ගැනීමේ කටයුතු ද සිදු කර ගත හැකි බැවින්, මෙය සුදුසු යෝජනාවක් බව දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

03. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ආදාහනාගාර සඳහා 37.5 Kg ගෑස් සිලින්ඩර් 03 ක් මිලදී ගැනීම වෙනුවෙන් වු රු. 54,450.00 ක මුදල සෝමසිරි ස්ටෝර්ස් (අඟුණුකොළපැලැස්ස) වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

04. තැන්පත් ලේඛණයේ කල් ඉකුත් පහත වර්ෂයන්ට අදාළ තැන්පත් සභා ආදායමට ගැනීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

**ආරක්ෂිත ඇප තැන්පත්**

| අනු අංකය | දිනය | ලදුපත් අංකය | නම | මුදල |
|---|---|---|---|---|
| 01 | 2016-04-30 | 24623 | ලේක් සයිඩ් ටුවරිස්ට් ඉන් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 15,000.00 |
| 02 | 2016-04-30 | 24619 | ඕලු හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 9,750.00 |
| 03 | 2016-04-30 | 24618 | ලේක්සයිඩ් හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 10,000.00 |
| 04 | 2016-04-30 | 24627 | එලිෆන්ට් බිම් හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 9,000.00 |
| 05 | 2016-04-30 | 24628 | තාවුල්ල රිසෝර්ට් හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 9,000.00 |
| 06 | 2016-05-03 | 23368 | සරායි විලේජ් හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 6,000.00 |
| 07 | 2016-05-03 | 24680 | කෙන්ට් හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 6,000.00 |
| 08 | 2016-5-04 | 107 | හොටෙල් චන්ද්‍රිකා - 2016 වර්ෂයට කසළ ගාස්තු | 11,250.00 |

| | | | | |
|---|---|---|---|---|
| 09 | 2016-06-06 | 686 | ශංගරි ලංකා විලේජ් හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 6,000.00 |
| 10 | 2016-05-09 | 142 | ද සෆාරි හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 22,950.00 |
| 11 | 2016-05-10 | 305 | ද රෙස්ට්‍රී හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 6,000.00 |
| 12 | 2016-05-11 | 312 | නිකාරා යාල බීච් හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 5,200.00 |
| 14 | 2016-05-05 | 478 | ෆ්ලවර් ගාඩ්න් රිසෝර්ට් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 5,200.00 |
| 15 | 206-05-25 | 470 | ඔක්රේ ලේක් රිසෝර්ට් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 11,250.00 |
| 16 | 2016-05-26 | 488 | හොටෙල් ටැමරින් ට්‍රි - 2016 වර්ෂයට කසළ ගාස්තු | 9,600.00 |
| 17 | 2016-05-30 | 654 | හොටෙල් රීෆ්‍රෙස් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 7,500.00 |
| 18 | 2016-04-27 | 016 | කිතලා හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 11,250.00 |
| 19 | 2016-10-14 | 017 | ගාර්ඩින් හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 12,000.00 |
| 20 | 2016-11-01 | 3028 | කැලෝරියන් රෙස්ටුරන්ට් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 7,500.00 |
| 21 | 2016-09-14 | 3610 | ජේඩ්වේ හොටෙල් - 2016 වර්ෂයට කසළ ගාස්තු | 7,500.00 |
| 23 | 2016-07-01 | 1416 | ද මූන් බීන් වයිල් සෙවණ | 9,000.00 |
| | | | | **196,950.00** |

**කඩකුලී තැන්පත්**

| අනු අංකය | දිනය | ලදුපත් අංකය | නම | මුදල |
|---|---|---|---|---|
| 01 | 2016-04-20 | 24726 | සුසිරිපාල සුදුසිංහ දෙබරවැව දියවර ගොඩනැගිල්ල අංක 07 | 3,600.00 |
| | | | | **3,600.00** |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

05. රට තුල පවතින අයහපත් ආර්ථික තත්ත්වය හා අනෙකුත් අර්බුදකාරී වාතාවරණය හේතුවෙන් තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු සියළු කඩකාමර වලින් අයකරනු ලබන මාසික කඩකුලී මුදල් ගෙවීම පැහැර හැරීමේදී අයකරනු ලබන 10% ක දඩ මුදල මෙම වාතාවරණය යථා තත්ත්වයට පත්වන තෙක් අයනොකර එම කඩබදුහිමියන් වෙත සහන ලබාදීමට ගත් යෝජනාව දැන් රට තුල පවතින සාමකාමී තත්ත්වය හා ආර්ථික තත්ත්වය බොහෝදුරට යථාතත්ත්වයට පත්වීම නිසා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු සියළු කඩකාමර වලින් අයකරනු ලබන මාසික කඩකුලී මුදල් ගෙවීම පැහැර හැරීමේදී අයකරනු ලබන 10% ක දඩ මුදල 2022 ඔක්තොම්බර් මස සිට අයකිරීම සුදුසු බවට මුදල් කමිටුව වෙත යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

06. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් පහත සඳහන් ස්ථාන වල පිහිටි කඩ කාමරයේ බදු අයිතිය පහත පරිදි සංශෝධනය කිරීම සුදුසු බවට යෝජනා කරමි.

| ස්ථානය | කඩ කාමර අංකය | දැනට බදු අයිතිය | පැවරීම | සම්බන්ධය |
|---|---|---|---|---|
| තිස්සමහාරාම නගර සභා කඩ කාමර | 02 | බී.ජේ. අමිල ප්‍රසංග | මලිත් පද්මික රූබසිංහ | එක්වන් මුදල අය කර |
| තිස්සමහාරාම පොදු වෙළඳපොළ කඩ බක්කි | 15 | ඩබ්. සිරිපාල | කේ.ජී. කාන්ති | ස්වාමියාගෙන් බිරිඳට |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

07. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවට අයත් තිස්සපුජා භූමි රථවාහන නැවතුම්පොලෙහි පිහිටි කඩකාමර සඳහා රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් 2022.09.29 දිනැතිව HT/RP/1108 දරණ අංකය යටතේ යොමුකර ඇති තක්සේරු වාර්තාව 2022 නොවැම්බර් මස සිට ක්‍රියාත්මක කිරීම සුදුසු බවට මෙම ගරු සභාව යෝජනා කරමි.

| කඩ කාමර අංකය | පැරණි මාසික තක්සේරු වටිනාකම | නව මාසික තක්සේරු වටිනාකම |
|---|---|---|
| කඩ කාමර අංක 01 සිට 08 දක්වා | රු. 1,200.00 | රු.1,500.00 (රු. එක්දහස් පන්සීයක් පමණි.) |
| කඩ කාමර අංක 09 | රු. 2,200.00 | රු. 2,500.00 (රු. දෙදහස් පන්සීයක් පමණි.) |
| කඩ කාමර අංක 10 | රු. 1,200.00 | භාවිතයට සුදුසු තත්ත්වයේ නැත. |
| කඩ කාමර අංක 11 සිට 29 දක්වා | රු. 1,200.00 | රු.1,500.00 (රු. එක්දහස් පන්සීයක් පමණි.) |

**(**2022.09.29 දිනැතිව **HT/RP/1108** දරණ අංකය යටතේ යොමුකර ඇති තක්සේරු වාර්තාව මේ සමඟ අමුණා ඇත.)

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

08. අංජලිගල ගල් රැන මාවත බොරලු යොදා සංවර්ධනය කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් සකස් කරන ලද වාර්තාවට අනුව, LM-8556 ටිපර් රථය සඳහා (වාර 24 ක්) රු. 280,000.00 ක මුදලක් ගෙවීම් සිදු කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චතුමිණි විජේනායක මෙනවිය විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

09. තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ වායු සමීකරණ යන්ත්‍ර 12 ක් වාර සේවා කිරීම සඳහා තිස්සමහාරාම සිරිවර්ධන රෙෆ් ඇන්ඩ් එයා සර්විස් ආයතනය විසින් ඉදිරිපත් කර ඇති රු. 98,400.00 ක ඇස්තමේන්තුව පිළිගෙන, එකී මුදල අදාළ ආයතනය වෙත ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

10. තිස්සමහරාම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල දියුණු කල ප්‍රදේශ වශයෙන් හඳුනාගත් පහත සඳහන් මාර්ගයන් දෙපස පිහිටි දේපල වලින් වරිපනම් බදු අයකර ගැනීමට වරිපනම් බදු පැනවීමට ප්‍රාදේශීය සභා පනතේ 134(1) වගන්තියට අනුව කටයුතු කිරීමට සුදුසු බවට මහ සභාවට යෝජනා කරමි.

I. තිස්සමහරාම වැල්ලවාය පාර කිරිදිඹය පාලම අසල සිට පන්නගමුව තුම්මන් හංදිය ඇල්ලගල හංදිය (වීරවිල වැල්ලවාය පාරට සම්බන්ධ වන ස්ථානය) දක්වා වූ ප්‍රධාන මාර්ගය දෙපස අයත්වන පරිදි,

II. තිස්සමහරාම කතරගම පාර අකුරුගොඩ මදච්ච ඇල අසල සිට පුල්පල්ලම කිරිදිඹය වම් ඉවුර ප්‍රධාන ඇල දක්වා වූ මාර්ගය දෙපස අයත් වන පරිදි,

III. තිස්සමහාරාම රබර්වත්ත පාර දූම්කොල ඇල අසල (තිස්ස වැව ගොඩ දොර ඇල රබර්වත්ත පාර හරහා ගමන් කරන ස්ථානය අසල) සිට රබර්වත්ත පාර දෙබරවැව - හම්බන්තොට මාර්ගයට සම්බන්ධවන ස්ථාය දක්වා ප්‍රධාන මාර්ග දෙපස අයත් වන පරිදි,

IV. තිස්සමහාරාම කච්චේරියගම අලුත්ගොඩ පාර ගොඩදොර ඇල මාර්ගය දක්වා ගමන් කරන ස්ථානය, ඒකි මාර්ගය දෙබරවැව - හම්බන්තොට ප්‍රධාන මාර්ගයට සම්බන්ධ වන ස්ථානය දක්වා වූ මාර්ගය දෙපස අයත් වන පරිදි,

V. යෝධකණ්ඩිය උපනගරය වැලිපොතේවල පාර ආරම්භ වන මන්සන්ධියේ සිට කිරින්ද නගරය නිදන්ගල වැල්ල දක්වා මාර්ගය අයත් වන පරිදි,

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>වරිපනම් බදු අය කරනු ලබන ප්‍රදේශයන් සඳහා ලබා දිය යුතු සේවාවන් අප ආයතනය විසින් ලබා දෙනු ලබයි. අනෙකුත් ප්‍රදේශවලට අවශ්‍යතාවය මත සුවිශේෂී සේවාවන් ඉටු කළද, ආයතනය වෙතින් ලබා දෙන අනෙකුත් සේවාවන් ලබා නොදෙනු ඇත. එම නිසා වරිපනම් ප්‍රදේශ පුළුල් කළ පසුව ආයතනයෙන් ලබා දෙන සේවාවන් සියල්ල අනෙකුත් ප්‍රදේශයන් සඳහා ද ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලදී.</u>

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා</u>

ඉහත යෝජනාවේ දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කර ඇති වසම්වලට අදාළව වරිපනම් බදු අය කිරීමට පෙර පක්ෂ විපක්ෂ ගරු සභිකයින් ගෙන්වා මේ සම්බන්ධයෙන් නැවතත් සාකච්ඡා කිරීම සුදුසු වන බව ප්‍රකාශ කරන ලදී.

වරිපනම් බදු ගෙවීමෙන් ජනතාවට ලැබෙන සේවාවන් හා ප්‍රතිලාභයන් කුමක්ද යන්න ජනතාව විසින් අප වෙතින් විමසීම් කරන බැවින්, මේ සම්බන්ධයෙන් කාරක සභා අවස්ථාවක් කර පැහැදිලිකිරීමක් සිදු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ සහ ආර්.කේ.එම්. රෝහිත මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

වරිපනම් බදු අය කිරීමේදී ඉඩමට වටිනාකමක් ලැබෙනු ඇත. යම් ගොඩනැගිල්ලක් ඉදි කර පසුව එම ගොඩනැගිලේ ද වටිනාකම තක්සේරු දෙපාර්තමේන්තුව විසින් වැඩි කරනු ඇත. ඊට අමතරව වරිපනම් ප්‍රදේශයේ කසළ එකතු කිරීම, මාර්ග සුද්ධ පවිත්‍ර කිරීම, විථි පහන් සවි කිරීම් හා නඩත්තු කටයුතු ආදිය අප ආයතනයේ සේවාවන් ලෙස ලබා දෙන බව ලේකම්තුමිය විසින් ප්‍රකාශ කරන ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා**</u>

වරිපනම් බදු අය කිරීම සඳහා ඉහත යෝජනාවෙන් දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කර ඇති වසම් දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කරන්නේ නම් එම ප්‍රදේශයට ද වටිනාකමක් එකතු වේ. එම නිසා මෙකී කරුණ සම්බන්ධයෙන් ගැටළුකාරී තත්ත්වයක් තිබේ නම් ප්‍රදේශයන්වලට අදාළ වෙළඳ සංගම් සහ අනෙකුත් සංවිධාන සමඟ සාකච්ඡා කර තීරණයක් ලබා ගැනීම සුදුසු බවත් ප්‍රකාශ කරන ලදී.

තවද, වරිපනම් බදු මුදල් දේපළෙන් දේපළට අය කරනු ලබන වටිනාකම් පිළිබඳ පැහැදිලි කිරීමක් සිදු කරන ලෙසට ආදායම් පරීක්ෂකතුමියට දන්වන ලදී.

- කාරක සභාවට කැඳවූ ආදායම් පරීක්ෂකතුමිය විසින් අදහස් දක්වමින්, දැනට අප සභාව විසින් 2007 වර්ෂයේ ලබා දී ඇති තක්සේරුව ක්‍රියාත්මක කරන අතර, අලුත් තක්සේරුවක් මේ වන තෙක් ලබා දී නොමැත. තක්සේරු දෙපාර්තමේන්තුව විසින් ඉඩම හෝ ගොඩනැගිල්ල හෝ අදාළ දේපළ සඳහා තක්සේරු වටිනාකමක් ලබා දුන් පසුව, එම තක්සේරු වටිනාකමින් 7% ක් වරිපනම් බදු වශයෙන් වාර්ෂිකව අය කරනු ලබයි. එම වාර්ෂික වරිපනම් බදු මුදල කාර්තු වශයෙන් කොටස් 04 කට ගෙවීම් සිදු කිරීමට අවස්ථාව ලබා දී ඇත. අදාළ වර්ෂයේ වරිපනම් බදු ජනවාරි මාසයේ දී ගෙවීම් සිදු කළහොත්, ඒ සඳහා 10% ක වට්ටමක් ලබා දෙන අතර, කාර්තු වශයෙන් ගෙවීමේදී අදාළ කාර්තුවේ මුල් මාසයේ දී සිදු කරන ගෙවීම් සඳහා 5% ක වට්ටමක් ද හිමි වනු ඇත. ඊට අමතරව අදාළ කාර්තුව සඳහා නියමිත වරිපනම් බදු ගෙවීම් පැහැර හැරීමේ දී නේවාසික දේපළක් සඳහා 15% ක් ද, වාණිජ දේපළක් සඳහා 20% ක් ද වශයෙන් අධි ගාස්තුවක් ද අය කරනු ඇත.

❖ <u>**අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා**</u>

තම කොට්ඨාසයේ යම් සීමාවක දැනට වරිපනම් බදු අය කරනු ලැබුවද, එම ප්‍රදේශයන්ට අප ආයතනය වෙතින් ලබා දෙන සේවාවන් නොලැබෙනු ඇත. එම නිසා දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කර වරිපනම් බදු අය කරන්නේ නම්, ඒ වෙනුවෙන් ලබා දිය යුතු සේවාවන් අනිවාරයෙන්ම ලබා දිය යුතුය.

රටේ පවතින ආර්ථික අර්බුධකාරී තත්ත්වය හමුවේ අප ප්‍රදේශයේ ව්‍යාපාරික ජනතාව බදු/බලපත්‍ර මුදල් ගෙවීම් කරන්නේ ද ඉතාමත් අසීරු තත්ත්වයක් යටතේය. ඒ අතරට දියුණු කළ ප්‍රදේශ ලෙස අප ප්‍රදේශ ද නම් කරමින් වරිපනම් බදු මුදල් අය කිරීමට කටයුතු කළහොත් ජනතාව තවත් අසරණ තත්ත්වයකට පත්වනු ඇත. මහසෙන්පුර කොට්ඨාසයේ බොහොමයක් මාර්ග සකස් කිරීමට ඇති අතර, ජලය නොමැති පවුල් බොහොමයක් සිටී. එම නිසා අප ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කර වරිපනම් බදු මුදල් අය කිරීමට කටයුතු කරන්නේ නම්, මෙකී සේවාවන්ද අනිවාරයෙන්ම ලබා දිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා**</u>

රන්මිණිතැන්න, පුල්පල්ම ප්‍රදේශය ජනතාව ඉතා දිළිඳුකමින් යුතුව ජීවත්වන ජනතාවක් සිටින ගම්මානයන් වේ. එම නිසා මෙකී ගම්මානය වරිපනම් අය කිරීම සඳහා දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කරන්නේ නම්, නැවත වාරයක් මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, වැල්ලගේ ජීවානි මහත්මිය**</u>

යම් ප්‍රදේශයක් දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කරන්නේ නම්, ඒ සඳහා බලනු ලබන නිර්ණායකයන් කවරේද යන්න විමසීම් කරන ලදී.

❖ <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 134-1 වගන්තිය යටතේ වරිපනම් බදු මුදල් අය කිරීමට අප ආයතනයට බලය හිමි වී ඇති බැවින්, වරිපනම් බදු අය කරන ප්‍රදේශ සඳහා අවශ්‍ය සේවාවන් ලබා දීම අප ආයතනය විසින් සිදු කළ යුතුය. වරිපනම් බදු අය කරන ප්‍රදේශවල කසළ ලබා ගැනීම ආදී සේවාවන් මේ වන විට සිදු කරන අතර, තවත් ඔවුන්ට ලබා දිය යුතු සේවාවන් හඳුනා ගෙන එකී සේවාවන්ද ලබා දීමට කටයුතු කළ හැකි බව සඳහන් කරන ලදී.</u>

යම් ප්‍රදේශයක මාර්ග පද්ධතිය සංවර්ධනය කර තිබීම, විදී පහන් ලබා දී තිබීම සහ ජල විදුලිය ලබා දී තිබේ නම් එම ප්‍රදේශය දියුණු කළ ප්‍රදේශයක් ලෙස නම් කළ හැකි බව ප්‍රකාශ කරන ලදී.

වරිපනම් දියුණු කළ ප්‍රදේශ ලෙස ගමෙහි නම සඳහන් කළද, එම ගමෙහි දියුණු කළ ප්‍රදේශයක් ලෙස වරිපනම් බදු අය කිරීම සඳහා ආවරණය විය යුතු කලාපයන් කවරේද යන්න ගරු සභිකයින් වෙතින් ලබා ගෙන, මෙකී යෝජනාව සංශෝධනය කර නැවත ඊළඟ මහා සභාවට ඉදිරිපත් කිරීමට තීරණය විය.

එසේම ඉහත යෝජනාවේ සඳහන් වසම් නියෝජනය කරන ගරු සභිකයින් විසින්, ඉහත යෝජනාවට දියුණු කළ ප්‍රදේශ ලෙස නම් කර ඇති වසම්, දියුණු කළ ප්‍රදේශයක් බවට සැලකිය හැකිද, දියුණු කළ ප්‍රදේශයක් බවට සැලකිය නොහැකිද, එසේත් නැතිනම් එම වසම්වලට අදාළව දියුණු කළ ප්‍රදේශයක් ලෙස ආවරණය විය යුතු කලාපයන් තිබේ නම් එකී විස්තර 2022 නොවැම්බර් මස පැවැත්වෙන මුදල් කමිටුවේ දී දන්වන ලෙසටත් වැඩි දුරටත් දන්වා සිටින ලදී.

✓ ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතාගේ පී.කේ. ආරියසේන මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් ගරු මහා සභාව කාරක සභාවක් බවට පත් විය.

එම යෝජනාව සංශෝධනය කර නැවත ඊළඟ මහා සභාවට ඉදිරිපත් කිරීමට තීරණය විය.

11. 2022.09.30 දිනට හිඟ වරිපනම් බදු ලේඛනය (වරිපනම් බදු ගෙවීම් පැහැර හරින්නන්ගේ ලේඛනය) පරිපාලන රීති 33,34 සහ 35 අනුව අවශ්‍ය ඉදිරි කටයුතු ගැනීම සඳහා මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා

හිඟව පවතින වරිපනම් බදු මුදල් වැඩසටහන් හෝ සංවිධානය කරමින් අය කර ගැනීමට කටයුතු කරන ලෙසට විගණන දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන්ම දන්වන කරුණකි. මෙසේ හිඟව පවතින වරිපනම් බදු මුදල් ගෙවීමට කටයුතු නොකිරීමෙන් රතු නිවේදන නිකුත් කර නීතිමය කටයුතු සිදු කිරීමට සිදු වන බවත්, දේපළ තහනම් කිරීමේ කටයුතු ද සිදු කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටින ලදී.

තවද, ඉදිරියේ දී වරිපනම් බදු මුදල් ඇතුළුව සියලුම බදු මුදල් මාර්ගගත (Online) ක්‍රමයට සිදු කිරීම සඳහා පළාත් පාලන දෙපාර්තමේන්තුව සමඟ සාකච්ඡා කර ඉදිරියේ දී වැඩපිළිවෙලක් සකස් කිරීමට කටයුතු කරන බවත් දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

12. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ පහත සඳහන් නිලධාරීන් හා සේවක මහත්ම මහත්මීන් සඳහා 2022 වර්ෂයට අදාළ නිල ඇඳුම් ලබා දීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | නම | තනතුර | අනු අංකය | නම | තනතුර |
|---|---|---|---|---|---|
| 1 | එම්.එල්.ඩී.පී. කුමාරි | ආ.වෛ.නි | 21 | එස්.පද්මිණී | සෞ.කම් |
| 2 | පී.එන්.මධුෂානි | ආ.වෛ.නි | 22 | පී.සරෝජාදේවී | සෞ.කම් |
| 3 | ඒ.එච්.ලීනා පුෂ්පකාන්ති | ආ.කම් | 23 | එම්.ගනේෂන් | සෞ.කම් |
| 4 | එස්.වසන්තා | සෞ.කම් | 24 | එස්.පුෂ්පරාණී | සෞ.කම් |
| 5 | කේ.පංචවර්ණ | සෞ.කම් | 25 | එච්.ඒ.සුමිතා | සෞ.කම් |
| 6 | එස්.සුනිල් ශාන්ත | සෞ.කම් | 26 | එල්.පී. ජගත් කුමාර | තා.සේ.නි |
| 7 | කේ.එස්.කමලා | සෞ.කම් | 27 | කේ.ඒ.සී.පී. කුමාර | වෙළඳපොළ පරිපාල |

| | | | | | |
|---|---|---|---|---|---|
| 8 | ආර්.එම්.වික්‍රමසිංහ | සෞ.කම් | 28 | එම්.පී.සරත් ද සිල්වා | වැඩ.ක්ෂේත්‍ර.ක |
| 9 | කේ.රාමක්‍රිෂ්ණන් | සෞ.කම් | 29 | එච්.පී.එන්.දයාවංශ | වැඩ.ක්ෂේත්‍ර.ක |
| 10 | ආර්.තුෂාරි | සෞ.කම් | 30 | පී.එම්.කේ.සුනිල් ශාන්ත | වැඩ.ක්ෂේත්‍ර.ක |
| 11 | කේ.තෙයිවානි | සෞ.කම් | 31 | පී.පී.නිලංග | වැඩ.ක්ෂේත්‍ර.ක |
| 12 | එම්.පාපා | සෞ.කම් | 32 | කේ.ආර්.දිලංකා ලක්ෂාණි | වැඩ.ක්ෂේත්‍ර.ක |
| 13 | කේ.මාලා | සෞ.කම් | 33 | ඩබ්.ඒ.නදීකා ලක්මාලි | වැඩ.ක්ෂේත්‍ර.ක |
| 14 | ආර්.ඩබ්.අනෝමා | සෞ.කම් | 34 | ජේ.කේ.ටී.සඳකැලුම් | වැඩ.ක්ෂේත්‍ර.ක |
| 15 | පී.රාජේශ්වරි | සෞ.කම් | 35 | ජේ.පී.ඉන්දික රුක්ෂාන් | පුස්තකාල කම්කරු |
| 16 | කේ.ශාන්ති | සෞ.කම් | | | |
| 17 | ජී.ශාන්ති | සෞ.කම් | | | |
| 18 | බී.සිරිල් | සෞ.කම් | | | |
| 19 | එම්.රෙංගනාදන් | සෞ.කම් | | | |
| 20 | කේ.එස්.රාජා | සෞ.කම් | | | |

- **රියදුරු හා කණිෂ්ඨ කාර්ය මණ්ඩලය**

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 1 | සුනිල් විතාරණගේ | කාර්යාල කාර්ය සහායක |
| 2 | ඊරෝෂ් නදීක දිසානායක | රියදුරු |
| 3 | කේ.එච්.ඒ. දිනෙත් චන්දිම | රියදුරු |
| 4 | ඊ.පී. වජිර චතුරංග | රියදුරු |
| 5 | එස්.කේ. සම්පත් ජයලාල් | රියදුරු |
| 6 | ඩබ්.ඒ. දයාරත්න | රියදුරු |
| 7 | ඩබ්. සුරංග ප්‍රියදර්ශන | රියදුරු |

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

- **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

නිල ඇඳුම් දීමනාව ලබා දීම සිදු නොකර, අදාළ සේවකයින් සඳහා නිල ඇඳුම අනිවාර්යයෙන්ම ලබා දිය යුතු බැවින්, අදාළ සේවකයින් සමඟ සාකච්ඡා කර, ඔවුන්ට වැඩ කිරීමේ දී ඇඳ සිටීමට පහසුවන ආකාරයේ ඇඳුමක් තෝරා ගැනීමට කටයුතු කරන ලෙසට ලේකම්තුමියට උපදෙස් ලබා දෙන ලදී.

එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

13. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව සතු වාහනවල භාවිතයෙන් ඉවත් කර ඇති ටයර් නැවත පිරවීම වෙනුවෙන් පන්නෙගමුව දක්ෂිණ ටයර් වර්ක්ස් ආයතනය වෙත ගෙවිය යුතු රු. 791,050.00 ක මුදල පහත සඳහන් බිල්පත් යටතේ ගෙවීම් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

- 2022.09.30 දිනැති බිල් අංක 105 යටතේ - රු. 497,700.00
- 2022.09.30 දිනැති බිල් අංක 106 යටතේ - රු. 164,000.00
- 2022.09.30 දිනැති බිල් අංක 107 යටතේ - රු. 129,350.00
- **මුළු එකතුව** **- රු. 791,050.00**

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>ආයතනයේ පවතින පැරණි ටයර් නැවත පිරවීම සිදු කළ නොහැකිව ප්‍රයෝජනයට ගත නොහැකි ලෙස පවතින ටයර් අපහරණය කිරීමේ දී රන්න ප්‍රදේශයේ ටයර් කුඩු කරන ආයතනයක් පවතින බැවින්, එම ආයතනය සම්බන්ධ කර ගනිමින් අදාළ කටයුතු සිදු කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

14. පන්නගමුව රාජපක්ෂ මාවත සංවර්ධනය කිරීම සඳහා යොදා ගනු ලැබූ අඩි 8 සිලින්ඩර් 03 ක් සඳහා රු.75000.00 ක මුදලක් අංක 442 බිල්පත යටතේ සමනල එන්ටර්ප්‍රයිසස් වෙත ගෙවීම් සිදු කිරීම සඳහා සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>**අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**</u>

<u>මන්ත්‍රී කොට්ඨාසයන්ට අදාළ මාර්ග නඩත්තු කිරීම් කටයුතු සිදු කළත්, පන්නෙගමුව කොට්ඨාසයේ මාගේ මෑණියන්ගේ නිවසට යන මාර්ගය මා සභාපති ලෙස කටයුතු කළද, සංවර්ධනය කර ගැනීමට කටයුතු සිදු නොකරන ලදී. පසුගිය මහා සභාවකදී එම මාර්ගය සංවර්ධනය කිරීම සඳහා මහා සභාවේ සම්මත කර දීම සම්බන්ධයෙන් ගරු උප සභාපතිතුමා ඇතුළු සියලුම ගරු සභිකයින් වෙත ස්තුතිය පුද කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

15. කාවන්තිස්සපුර පෙර පාසල අලුත්වැඩියා කිරීමේ දෙවන අදියරේ කටයුතු සිදු කිරීම සඳහා පහත සඳහන් ද්‍රව්‍ය මිලදී ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| | |
|---|---|
| ➢ Interlock | - 7200 Available |
| ➢ ABC mixtury | - 6.5 Cube |
| ➢ Quary dust | - 3.0 Cube |
| ➢ Cement | - 41 bag |
| ➢ Sand | - 2.0 Cube |
| ➢ Metal ¾’’ | - 2.0 Cube |
| ➢ Metal 1’’ | - 0.5 Cube |
| ➢ Cement Block | - 125.0 Nr |
| ➢ Bath room set with Rocell | - 01 Nr |
| ➢ Tap for wash basing desigle | - 01 Nr |
| ➢ Waste Compling Desigle DS 01 5’’ | - 01 Nr |
| ➢ 450 mm long flexible hose ‘’spain’’ | - 02 Nr |
| ➢ Bidet shower chromium plated ‘’Desigle’’ | - 01 Nr |
| ➢ Angle valve – Desigle | - 02 Nr |
| ➢ 1’’ thick steel plate 10’’ height | - L.ft 525.0 |
| ➢ Approvel Soil | - 6 Cubes Available |
| ➢ 2’x6 ½’ size plastic door | - 01 Nr |
| ➢ 2 ½’’x6 ½’’ Size plastic door | - 01 Nr |
| ➢ Brass screens 2’’ | - 16 Nr |
| ➢ Rawl plug | - 16 Nr |
| ➢ Aluminium paweer coated | - 0.9 sq.m |

- Supplying & fixing 0.8 x 1.87 Jack timber door - 01 Nr
- 9’’ with 8’’ hight Steel plate - 04 Nr
- 9’’ with 9’ height Steel plate - 04 Nr
- 9’’ width plywood sheet (15 mm thick) - 17.24 m
- 10 mm tor sheet bar - 08 Nr
- 9’’x9’’ stirrups - 130 Nr
- Squatting pan with trap & footrest (rocell) - 1.0 Nr
- Corrugated asbestos Sheet - 55.0 sq.ft (Available)
- 2’’x2’’ bearers - 20.0 Lft (Available)
- Roofing bolts with nut & washer - 10 Nos
- 2’’ Wire Nail - 200 g
- 3’’ Wire Nail - 150 g
- Impated timber - Available
- PVC pipe 4’’ - 9.0 lft
- PVC pipe 1’’ - 7.0 Lft
- Aluminium pater coated fanlight (1.5’x1.5’ size) - 01 Nr
- Concrete Mixtury - Two days (Rent)

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

16. 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශ සඳහා වූ විස්තරාත්මත කළමනාකරණ විගණකාධිපති වාර්තාවේ නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපළ, පිරියත හා උපකරණ යටතේ දක්වා ඇති සභාව සතු කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය ගල් කුෂරය හා කිලෝ 50 ධාරිතාවයක් ඇති බෝල් වීල් යන්ත්‍රය වෙන්දේසි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම සම්බන්ධයෙන් අනුමැතිය ලබා ගැනීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>සභාව සතු කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය ගල් කුෂරය හා කිලෝ 50 ධාරිතාවයක් ඇති බෝල් වීල් යන්ත්‍රය සම්බන්ධයෙන් ගන්නා ලද ක්‍රියාමාර්ග පිළිබඳව විගණන දෙපාර්තමේන්තුව විසින් නිරන්තරයෙන්ම පෙන්වා දෙන කරුණක් වී ඇත. එම නිසා මෙම යෝජනාවේ සඳහන් බෝල් වී යන්ත්‍රය මැටි කර්මාන්තයක් සඳහා ලබා දිය හැකි බැවින්, 50 ධාරිතාවයක් ඇති බෝල් වීල් යන්ත්‍රය යෝජනාවෙන් ඉවත් කර, කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය ගල් කුෂරය වෙන්දේසි කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.</u>

<u>කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය ගල් කුෂරය අසාර්ථක ව්‍යාපෘතියකි. මෙම ව්‍යාපෘතියෙන් කිසිදු ප්‍රයෝජනයක් ගත නොහැකි නිසා, වෙන්දේසි කිරීම සුදුසු බවට තීරණය කරන ලදී.</u>

❖ **<u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්. රජිත ප්‍රියදර්ශන මහතා</u>**

සභාව සතු කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය ගල් ක්‍රෂරය අපට තිබෙන සම්පතක් නිසා, මෙම යන්ත්‍රයෙන් ප්‍රයෝජනයක් ගත හැකි වැඩසටහනක් සකස් කිරීමට හැකියාව පවතින්නේ නම් එය වඩාත් සුදුසු බව දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

17. ඩබල් ට්‍රී බයි හිල්ටන් හෝටලයෙහි නීතිඥ නිලධාරියා වශයෙන් නිතිඥ සම්සුදීන් මහතා පෙනී සිටීම හේතුවෙන්, සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් සඳහා නඩු පැවරීමේ දී, නඩු කටයුතු සඳහා පෙනී සිටීමට නොහැකි වීම මත, එම නඩු කටයුතු සඳහා නීතිඥ සම්සුදීන් මහතා වෙනුවට නීතිඥ සුරංග වන්නිආරච්චි මහතා පත් කිරීම සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

18. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ 2023 වර්ෂයට දේපළ බදුදීම වෙනුවෙන් 2022.10.14 දින පෙ.ව. 10.30 ට ටෙන්ඩර් විවෘත කිරීම සිදු කළ අතර, එහිදී දේපළ 15 ක් සඳහා ලංසු කැඳවීම සඳහා දැන්වීම් පළ කරන ලද බවත්, ඉන් දේපළ 09 ක් සඳහා ලංසු 10 ක් ඉදිරිපත් වන ලදී. ඒ අනුව පහත නම් සඳහන් ටෙන්ඩර්කරුවන් වෙත ටෙන්ඩරය පිරිනමන ලද බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | ස්ථානය | නම | අවම ගංසු මුදල | ලංසු මුදල (රු) |
|---|---|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | නලගමගේ කීර්ති රත්න | 1644000.00 | 1,646,000.00 |
| 02 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | ඩබ්.ජී. පසිඳු වර්ණ කුමාර | 495,882.00 | 610,600.00 |
| 03 | කිරින්ද පූජා නගර පැරණි සහ නව වැසිකිළිය | වේලු කරුපයියා | 108,000.00 | 109,000.00 |
| 04 | කිරින්ද වෙරළ වැසිකිළිය හා නාන ස්ථානය | දිලුම් තාරක වේරගොඩආරච්චි | 165,700.00 | 165,800.00 |
| 05 | තිස්සමහාරාම පූජා නගර වැසිකිළිය | කරුපන් ඉන්ද්‍රාණි | 137,910.00 | 138,500.00 |
| 06 | තිස්සමහාරාම බස්නැවතුම්පොළ නව වැසිකිළිය | වේලු කරුපයියා | 15250.00 | 16,000.00 |
| 07 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ පොල් ඵලදාව (පොල් ගස් 08) | වැල්ලහේනගේ සිරිසේන | 8040.00 | 9,600.00 |
| 08 | අකුරුගොඩ හන්දිය කඩ කාමර අසල නව වැසිකිළිය | පටබැඳි ආරච්චිගේ ගාමිණී | 3168.00 | 3,960.00 |
| 09 | තිස්සමහාරාම පැරණි බස්නැවතුම්පොළ පොල් ඵලදාව (පොල් ගස් 04) | වැල්ලහේනගේ සිරිසේන | 3690.00 | 5,130.00 |

**<u>ටෙන්ඩර් නොවූ දේපළ 06</u>**

| අනු අංකය | ස්ථානය | අවම ලංසු මුදල (රු) |
|---|---|---|
| 01 | දෙබරවැව පොදු වෙළඳපොළ | 2,078,181.81 |
| 02 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | 1,207,710.00 |
| 03 | දෙබරවැව ධීවර වෙළඳසැල | 120,000.00 |

| | | |
|---|---|---|
| 04 | දෙබරවැව ධීවර ගොඩනැගිල්ල | 162,000.00 |
| 05 | අකුරුගොඩ හන්දිය වැසිකිළිය | 3,168.00 |
| 06 | තිස්සමහාරාම මාගම අක්කර 18 පොල් එළදාව | 2,250.00 |

තවද, ටෙන්ඩර් නොවූ දේපළ සඳහා ප්‍රාදේශීය ටෙන්ඩර් පටිපාටිය අනුව ටෙන්ඩර් කිරීම සුදුසු බව ටෙන්ඩර් කමිටුව තීරණය කළ අතර, එය මෙම ගරු සභාවේ අනුමැතිය සඳහා මෙම ගරු සභාවට ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

අකුරුගොඩ වැසිකිළිය බදු අය කරන බදුකරු විසින් අප ගිවිසුම් ගත වී ඇති මුදලට වඩා වැඩි මුදලක් අය කරන බවට කරුණු දැන ගැනීමට ලැබී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් සොයා බැලීමක් සිදු කරන ලෙසට ආදායම් පරීක්ෂක තුමියට උපදෙස් ලබා දෙන මෙන් ලේකම්තුමියට දන්වන ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

19. පහත සඳහන් දේපළ බදු අයිතිය ලබා ගෙන ඇති බදුකරුවන් විසින්, පහත මාසයන් වලට සහන ලබා දෙන ලෙස ඉල්ලා ඇති බැවින්, එම සහනයන් ලබා දීම සඳහා අනුමැතිය ලබා දෙන ලෙසට මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංකය | දේපළ විස්තරය | සහන ඉල්ලීම් කරන මාසය |
|---|---|---|
| 01 | පන්නෙගමුව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | ජූලි , අගෝස්තු |
| 02 | දෙබරවැව පොදු වෙළඳපොළ හා වැසිකිළිය | ජූලි , අගෝස්තු |
| 08 | තිස්සමහාරාම පූජා නගර රථවාහන නැවතුම්පොළ | ජූලි , අගෝස්තු |
| 09 | කිරින්ද පූජා නගර රථවාහන නැවතුම්පොළ | ජූලි , අගෝස්තු , සැප්තැම්බර් |

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

ඉහත කී දේපළයන්වලට අදාළ බදු සහන ලබා දීමේදී ඒ සඳහා ආදායම් පරීක්ෂකතුමිය වෙතින් වාර්තා ලබා ගෙන, ඒ අනුව අවශ්‍ය ඉදිරි කටයුතු සිදු කර පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත යොමු කිරීම සුදුසු බවට තීරණය විය.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

20. පෙර පාසල් දරුවන්ගේ පෝෂණය ඉහල නැංවීමේ වැඩසටහනට සමගාමීව මූලික පියවර ලෙස දකුණු පළාත්, පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක පෙර පාසල් දරුවන් සඳහා පෝෂණ ආහාරවේලක් ලබා දීම සඳහා කටයුතු සැලසුම් කර, පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදවා අදාළ කටයුතු සිදු කරන ලෙස පළාත් පාලන දෙපාර්තමේන්තුව (දකුණු පළාත) මගින් දන්වා ඇත. (එක් දරුවකු සඳහා රු. 60.00 ක මුදලක් වැය කිරීමට හා ඔක්තෝම්බර් මාසය සඳහා දින 08 ක් දරුවන් වෙනුවෙන් ප්‍රෝටීන බහුල ආහාරයක් ක් ලබා දීම) ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ගරු ආණ්ඩුකාරතුමා වෙතින් ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී'
එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

21. දෙබරවැව ඇන්.ටී. දයානන්ද පොදු ක්‍රීඩාංගනයේ 2022.09.28 දින සිට පැවැති අධ්‍යාපන හා වෙළඳ සැණකෙළිය වෙනුවෙන් තැන්පත් කරන ලද ඇප තැන්පතු මුදල වන රු. 50,000.00 ක මුදල චින්තක ඉලෙක්ට්‍රිකල්ස් ආයතනය වෙත නිදහස් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, එන්.ජී. සරත් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

22. මාගම අක්කර 20 මාර්ගයේ බෝක්කුව සකස් කිරීම සඳහා යොදා ගනු ලැබූ හියුබ් පයිප්ප මිලදී ගැනීම වෙනුවෙන් සමනල එන්ටර්ප්‍රයිස්ස ආයතනය වෙත අංක 439 බිල්පත යටතේ රු. 65,000.00 ක මුදල ගෙවීම් කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

23. මහජන බැංකුව තිස්සමහාරාම ශාඛාවේ පවත්වාගෙන යනු ලබන අංක 061-1-001-9-5074040 දරණ ජංගම ගිණුමට (මාගල) අදාළ චෙක්පත් හි අත්සන් කිරීමේ පළමු අණකරු ලෙස තිස්සමහාරාම ප්‍රාදේශීය සභාවේ ලේකම්, ඩී. රුවිනා දීපානි මහත්මිය සහ දෙවන අණකරු ලෙස ප්‍රධාන කළමනාකරණ සේවා නිලධාරී, කේ.එන්.ජී.පී. නදීෂිකා මහත්මිය වෙත බලය පැවරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු උප සභාපති, සුදත් විදානගමගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

24. තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව මගින් පාලනය කරනු ලබන තිස්සමහාරාම හා යෝධකණ්ඩිය නිදහස් ආයුර්වේද මධ්‍යස්ථාන සඳහා (රු.300,000) ඖෂධ මිලදී ගැනීමට අවශ්‍යව ඇත.ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී
එම යෝජනාව ඒකමතිකව සභා සම්මත විය.

25. තිස්සමහාරාම බල ප්‍රදේශයේ කිරින්ද, අන්දරගස්යාය, මාගම, තිස්සමහාරාම යන ප්‍රදේශවල ප්‍රදේශවාසීන් සඳහා ප්‍රවාහන පහසුකම් ලබා ගැනීමට බස් රථයක දැඩි අවශ්‍යතාවය පවතින බැවින්, මෙකී ප්‍රදේශයන් හරහා අලුතින් බස් රථයක් ධාවනයට එක් කර ගැනීමට හැකි වුවහොත්, එමගින් රාජ්‍ය ආයතන නිලධාරීන්, පාසල් ළමුන් සහ ප්‍රදේශවාසීන් සඳහා නගරයට හා රාජකාරී කටයුතු කරන ස්ථාන වෙත යාමටත්, ප්‍රදේශවාසීන්ගේ අවශ්‍යතාවයන් ඉටු කර ගැනීම සඳහා නගරයට හෝ වෙනත් ප්‍රදේශවලට යමට සහ මෙම ප්‍රදේශයන්වල සිට රෝගීන් බැලීම සඳහාත් ප්‍රතිකාර ලබා ගැනීම සඳහාත් කරාපිටිය රෝහල සඳහා යාමට හැකියාව ලැබෙන බැවින්, පහත සඳහන් වේලාවන් වලදී ඉහත සඳහන් ප්‍රදේශයන් හරහා ප්‍රවාහන පහසුකම ලබා ගැනීමට අලුතින් බස් රථයක සේවාව ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

- කිරින්ද සිට - පෙ.ව. 6.45
- තිස්සමහාරාමයට - පෙ.ව. 7.40
- කරාපිටියට - මධ්‍යහන 12.00

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතා විසින් ස්ථිර කරන ලදී.

- <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතා</u>

තිස්සමහාරාම බල ප්‍රදේශයේ කිරින්ද, අන්දරගස්යාය, මාගම, තිස්සමහාරාම ප්‍රදේශයන් හරහා බස් රථයක් ධාවනය කිරීමේ අවශ්‍යතාවය දැඩිව පවතින නිසාත්, එකී මාර්ගයේ බස් රථ ධාවනයට එක් කළත් එය අඛණ්ඩව සිදු නොවන නිසා, මේ සම්බන්ධයෙන් ප්‍රදේශයේ බස් රථ හිමියකු වන එම්.කේ. නන්දසිරි යන අය සමඟ සාකච්ඡා කළ පසුව, ප්‍රදේශයට බස් රථයක අවශ්‍යතාවය දැඩිව පවතින නිසා ප්‍රදේශවාසීන්ට ලබා දෙන සේවාවක් ලෙස ලාභ පාඩු නොතකා අඛණ්ඩව එකී සේවාව ලබා දීමට අවශ්‍ය සහයෝගය දැක්වීමට එම බස් රථ හිමියා විසින් කැමැත්ත පල කර ඇති බව ඉහත ප්‍රදේශවාසීන් විසින් ඉදිරිපත් කර ඇති අත්සන්

සහිත ලිපිය මගින් දන්වා ඇති බැවිනුත්, මෙකී සේවාව අත්‍යාවශ්‍ය සේවාවක් වන බැවිනුත්, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති, චමල් රාජපක්ෂ මැතිතුමා වෙත යොමු කර මෙකී සේවාව ලබා ගැනීම සුදුසු බව දන්වා සිටින ලදී.

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

26. පෙර පාසල් දරුවන්ගේ පෝෂණය ඉහල නැංවීමේ වැඩසටහනට සමගාමීව මූලික පියවර ලෙස දකුණු පළාත්, පළාත් පාලන ආයතන යටතේ ක්‍රියාත්මක පෙර පාසල් දරුවන් සඳහා පෝෂණ ආහාරවේලක් පළාත් පාලන ආයතන සතු අරමුදල් යොදවා සිදු කරන ලෙසට පළාත් පාලන දෙපාර්තමේන්තුව (දකුණු පළාත) වෙතින් දැන්වීමෙන් පසු, සභාව සතු පෙර පාසල් සඳහා පෝෂණ ආහාරවේල මේ වන විට ලබා දෙන බැවින්, බල ප්‍රදේශයේ පවත්වාගෙන යනු ලබන පෞද්ගලික පෙර පාසල් දරුවන් සඳහා ද එම පෝෂණ ආහාර වේල ලබා දීම සඳහා, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති, චමල් රාජපක්ෂ මැතිතුමා සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමා වෙත දන්වා ඊට අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා අනුග්‍රහය ලබා ගැනීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ඩබ්.කේ. ටෂිත සමිල මහතා විසින් ස්ථිර කරන ලදී.

- ❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති, චමල් රාජපක්ෂ මැතිතුමා සහ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මැතිතුමා වෙතින් පෞද්ගලික පෙර පාසල් දරුවන් සඳහා ද පෝෂණ ආහාරවේල ලබා දීමට අවශ්‍ය ප්‍රතිපාදන පළාත් පාලන දෙපාර්තමේන්තු හරහා ප්‍රාදේශීය සභාවට ලබා ගැනීමට හැකි වුවහොත්, සභාවේ පෙර පාසල් දරුවන් සඳහා ලබා දෙන ආකාරයට විධිමත්ව හා ඉතාමත් පිරිසිදුව පෞද්ගලික පෙර පාසල් දරුවන් සඳහා ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලදී.</u>

එම යෝජනාව ඒකමතිකව සහා සම්මත විය.

27. පන්නෙගමුව රාජපක්ෂ මාවත නඩත්තු කිරීම සඳහා යොදා ගනු ලැබූ LM-8556 ටිපර් රථ වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම සඳහා තාක්ෂණ සේවා නිලධාරී විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව, රු. 170,000.00 ක මුදලක් ආදිත්‍ය කන්ස්ට්‍රක්ෂන් ආයතනය වෙත ගෙවීම් සිදු කිරීම සුදුසු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා විසින් ස්ථිර කරන ලදී.
එම ජනාව ඒකමතිකව සහා සම්මත විය.

28. දෙබරවැව ඉමෙඩ්රෝ ෆාමසිය අසලින් දෙබරවැව පොළ භූමියට ප්‍රවේශ වන මාර්ගය අලුත්වැඩියා කිරීම සඳහා රු. 521,235.00 කින් යුත් සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කර ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම ජනාව ඒකමතිකව සහා සම්මත විය.

29. පන්නෙගමුව ගොවි සෙවණ ක්‍රීඩාංගනය වටා විදුලි කණු ස්ථාපිත කිරීම සඳහා රු. 1,684,342.00 ක වටිනාකමින් යුත් සංශෝධිත ඇස්තමේන්තුව අනුමත කර ගැනීම සඳහා මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා විසින් ස්ථිර කරන ලදී.
එම ජනාව ඒකමතිකව සහා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතා</u>**

30. තිස්සමහාරාම, රණකෙලිය තඹරව වුස්සදේව ගොවි සංවිධානයට අයත් තඹරව වැව යටතේ කුඹුරු වගා කරන ඉඩම්හිමියන් විසින් 1950 වර්ෂයේ සිට ඉඩම් බලපත්‍ර ඉල්ලා ඇත. සාමාජිකයින් 60 දෙනාගෙන් 40 කට ඉඩම් බලපත්‍ර ලබා දී ඇති අතර, ඉතිරි 20 දෙනා ද වසකට කිහිප වතාවක්ම මේ සම්බන්ධයෙන් ඉල්ලීම් කළද, මෙතෙක් එය ඉටු කර ගැනීමට නොහැකි වී ඇති බැවින්, ඉතිරි 20 දෙනා සඳහා ද බලපත්‍ර ලබා දීම සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමට මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා විසින් ස්ථිර කරන ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>සාමාජිකයින් 60 දෙනාගෙන් 40 දෙනෙකු සඳහා බලපත්‍ර ලබා දීමේදී ඉතිරි 20 දෙනා ද එම කාලයේ සිටි බවට තහවුරු කරන ලිපි ලේඛන සහ ලබා දී ඇති බලපත්‍රයේ පිටපතක් ලබා දුන්හොත්, මේ සම්බන්ධයෙන් සොයා බැලිය හැකි බව ප්‍රකාශ කර සිටින ලදී.</u>

එම ජනාව ඒකමතිකව සභා සම්මත විය.

❖ **<u>රීති අංක 11 (8) යටතේ ඉදිරිපත් කරන ලද යෝජනා</u>**

- **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ජී.එච්.ජී. නීටා මහත්මිය</u>**

31. පන්නෙගමුව වසමේ දියබැදිය විහාරස්ථානය අසල ස්ථිර පදිංචි පවුල් 10 ක් පමණ සිටින අතර, ලුණුගම්වෙහෙර ජාතික ජල සම්පාදන මණ්ඩලය වෙත ජලය ලබා ගැනීම සඳහා 2018 වර්ෂයේ සිට ඉල්ලීම් කර ඇතිමුත්, මෙතෙක් ජලය ලබා ගැනීමේ කටයුතු සිදු කර ගැනීමට නොහැකි වී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමටත්, මෙකී කරුණ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා යොමු කිරීමට කටයුතු සිදු කරන ලෙසටත් මෙම ගරු සභාවට යෝජනා කරමි.

එම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා සභික, චමින්ද ඩයස් වන්නිගේ මහතා විසින් ස්ථිර කරන ලදී.
එම ජනාව ඒකමතිකව සභා සම්මත විය.

**(ඊ) කාරක සභාවල වාර්තා සළකා බැලීම -**

❖ 2022.10.02 වන දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.10.02 වන දින පැවති නිවාස හා ප්‍රජා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

❖ 2022.10.02 වන දින පැවති කාර්මික සේවා කාරක සභා වාර්තාව සළකා බැලීම.

සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

- ❖ 2022.10.02 වන දින පැවති පරිසර හා පොදු පහසුකම් කාරක සභා වාර්තාව සළකා බැලීම.

  සභා කැඳවීමේ හා න්‍යාය පත්‍රය සමඟ සියලුම සභිකයන් වෙත මෙම කාරක සභා වාර්තාව ලබා දී ඇති බවත්, ඒ හා සම්බන්ධ ගැටලු පවතින්නේ නම්, ඒවා සාකච්ඡා කිරීම හෝ සළකා බැලීම හෝ සංශෝධනය කිරීම මේ අවස්ථාවේ කළ හැකි බව ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ප්‍රකාශ කරන ලදී.

## (ඖ) වෙනත් කරුණු

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතාගේ අදහස් දැක්වීම</u>**

පන්නෙගමුව කොට්ඨාසයේ මාර්ග 02 ක් සකස් කිරීමේ කටයුත්ත මීට ඉහතදී මා ද මැදිහත් වී සිදු කරන ලදී. එසේම තිස්සමහාරාමයෙන් පිටත ප්‍රදේශයක මාර්ග සකස් කිරීමේ කටයුත්තට මා ගිය පසුව, එම ප්‍රදේශයේ මාර්ග සකස් කිරීමේ කොන්ත්‍රාත්තුව ලබා ගන්නේ එම ප්‍රදේශයේම ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන් විසින්ය. එසේම ඊට අවශ්‍ය රථවාහන පළාත් පාලන ආයතනයක සභාපතිතුමා වෙතින් ලබා ගනු ලබයි. එකී කරුණ දෙස බලන කල මා තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව නියෝජනය කරමින් වසර 12 ක පමණ කාලයක් කටයුතු කර ඇත. ඉන් එක් වසරක දී හෝ ප්‍රාදේශීය සභාවේ මන්ත්‍රීන් විසින් කිසිදු කොන්ත්‍රාත්තුවක් ලබා ගෙන නොමැති අතර, සභාවෙන් සිදු කරන ලද සියලුම ව්‍යාපෘති සෘජු ශ්‍රමික පදනම සිදු කර, යම් මුදලක් ඉතිරි කර ගැනීමටත් කටයුතු කරනු ලබයි. මෙසේ කරුණු දෙස බැලීමේ දී අප සභාවේ ගරු සභාපතිතුමා, ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් එසේ සිදු නොකිරීම සතුටටත් අභිමානයටත් කරුණක් බව ප්‍රකාශ කළ යුතුය.

වසර 10 කට පසුව වැලිපොතේවල පාළම කැඩී තිබීම නිසා ප්‍රවාහනයට එක් කර තිබූ බස් රථය නැවත පාළම සකස් කිරීමත් සමඟ ධාවනයට එක් කර ගැනීමට මැදිහත් වී කටයුතු කිරීම සම්බන්ධයෙන් ගරු සභික, වාලි ගුණරත්න මහතා වෙත ස්තූතිය පුද කරන ලදී.

අප කොට්ඨාසයට අයත් මාර්ග කිහිපයක් සකස් කිරීමට ඇති බැවින්, එම මාර්ග සකස් කර ගැනීම සඳහා මෝටර් ග්‍රේඩරය ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

යෝධකණ්ඩිය ප්‍රදේශයේ ඉතාමත් අසරණව ජීවත් වන ජනතාවක් සිටින බැවින්, වරිපනම් දියුණු කළ ප්‍රදේශ නම් කිරීමේදී යෝධකණ්ඩිය ප්‍රධාන පාර පමණක් ආවරණය වන පරිදි නම් කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.කේ.එම්. රෝහිත මහතාගේ අදහස් දැක්වීම</u>**

උද්ධකන්දර සිට මිල්ලත්ත හන්දිය දක්වා මාර්ග සුද්ධ කර ගැනීම සඳහා මෝටර් ග්‍රේඩරය ලබා දෙන්නේ නම්, ඊට අවශ්‍ය ඉන්ධන ගොවි සංවිධානය හරහා ලබා දිය හැකි බව ප්‍රකාශ කරන ලදී. තවද, එකී මාර්ගයේම ස්ථාන 02 ක් ගිලා බැස ඇති බැවින් මේ සම්බන්ධයෙන් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා අවශ්‍ය කටයුතු සිදු කර දෙන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

රටේ පවතින ආර්ථික අර්බුධකාරී තත්ත්වයන් සමඟ පොලිස් ස්ථාන වෙතින්ද යම් යම් සුළු හේතූන් මත දඩ අය කිරීම් සිදු කරනු ලබයි. බීමත්ව රිය පැදවීම, හෙල්මට් නොපැළ රිය පැදවීම, වේගයෙන් රිය පැදවීම ආදී කරුණු සාධාරණ හේතු වුවත්, බලපත්‍රයේ කාලය ඉකුත් වී දින 02 ක් ගත වීම හේතුවෙන් යන සුළු හේතූන් මත දඩ ගැසීම සාධාරණ නොවන බැවින්, මේ සම්බන්ධයෙන් පොලිස් ස්ථානය වෙත දන්වා එවැනි කරුණු සඳහා ගම්වල ජනතාවට සාධාරණයක් හෝ සහනයක් ලබා දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

බංගලාවත්ත මැදින් යන ජනසවි පාර ගමන් කිරීමට නොහැකි ලෙස අබලන් වී ඇති බැවින්, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසට ඉල්ලා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>උද්ධකන්දර සිට මිල්ලත්ත හන්දිය දක්වා මාර්ගයේ ගිලා බැස ඇති ස්ථාන 02 සම්බන්ධයෙන් තාක්ෂණ සේවා නිලධාරී ගොස් ලබා දෙන වාර්තා අනුව, මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලිඛිතව දන්වා යැවීමට තීරණය විය.</u>

<u>පොලිස් නිලධාරීන් දඩ කොළ නිකුත් කිරීමට කටයුතු කරනු ලබන්නේ ඔවුන්ට පැවරී ඇති පොලිස් නීතිය අනුවය. එම නිසා ඒ සඳහා අපට මැදිහත්වීමක් සිදු කළ නොහැක. යම් පුද්ගලයෙක්ට සාධාරණව වැරැද්දක් නොමැතිව දඩ ගැසීමක් සිදු කර ඇත්නම්, ඒ සම්බන්ධයෙන් පොලිස් ස්ථානාධිපතිතුමා වෙත දැන්විය හැකි බව ප්‍රකාශ කර සිටින ලදී.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, පී.කේ. ආරියසේන මහතා අදහස් දැක්වීම</u>**

උද්ධකන්දර සිහිනි අසපු පෙර පාසලට පසුගිය දිනකදී රාත්‍රී කාලයේ දී කොටියෙක් පැමිණීම නිසා පෙර පාසල් දරුවන්ගේ දෙමාපියන් දරුවන් පෙර පාසල වෙත එවීමටත් ඉතාමත් බියෙන් පසුවන බැවින්, මේ සම්බන්ධයෙන් වනජීවි දෙපාර්තමේන්තුව වෙත දන්වා කඩිනමින් විසඳුමක් ලබා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

විලමුල්ල මාතෘ නිවාසය වටා සුද්ධ පවිත්‍ර කර ගැනීම සඳහා ජේ.සී.බී. යන්ත්‍රය ලබා දීම සම්බන්ධයෙන් ස්තුතිය පුද කර සිටින අතර, ඒ පිළිබඳ වෛද්‍ය අධිකාරීතුමාට ස්තුතිය පුද කළ බව දන්වා සිටින ලදී.

සෙනවිරාජගමට පිවිසෙන මාර්ගය ගමන් කිරීමට නොහැකි ලෙසට අබලන් වී ඇති බැවින්, හැකි නම් එය නඩත්තු කර දෙන ලෙසට ඉල්ලා සිටින ලදී.

සභාව සතු පෙර පාසල් සඳහා පෝෂණීය ආහාරවේලක් ලබා දීමට කටයුතු කිරීමට ඉතාමත් හොඳ දෙයක් වනවා සේම, එලෙසට අනෙක් පෙර පාසල් දරුවන් සඳහාද පෝෂණ ආහාරවේලක් ලබා දීමට වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු බව දන්වා සිටින ලදී.

❖ **<u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>**

<u>උද්ධකන්දර සිහිනි අසපු පෙර පාසලට රාත්‍රී කාලයේ කොටියා පැමිණියද එය ඉතාමත් අනතුරුදායක බැවින්, ඒ සම්බන්ධයෙන් වනජීවි දෙපාර්තමේන්තුව වෙත දන්වා යැවීමට තීරණය විය.</u>

❖ **<u>ගරු ප්‍රාදේශීය සභා සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතාගේ අදහස් දැක්වීම</u>**

බල ප්‍රදේශයේ අනෙකුත් කොට්ඨාසයන්හි ද සුසාන භූමි තිබියදී බොහෝ මෘත දේහ මිහිදන් කිරීමට අකුරුගොඩ සහ මහසෙන්පුර සුසාන භූමිවලට ගෙන ඒමත් සමඟ එකී සුසාන භූමිවල ඉඩකඩ ඇහිරී ඇති බැවින්, මේ සඳහා යම් විසඳුමක් ලබා ගත යුතු බව ප්‍රකාශ කරන ලදී.

දෙබරවැව පොදු ක්‍රීඩාංගනය නවීකරණය කර අඩුපාඩු සකස් කිරීම පිළිබඳ ප්‍රථමයෙන් ස්තුතිය පුද කරන ලදී. එසේම ක්‍රීඩාංගනය පිටුපස තිබෙන ක්‍රීඩා භාණ්ඩ දමා ඇති කාමරයේ යතුර හිටපු ක්‍රීඩා නිලධාරී ළඟ තිබීම නිසා, අවශ්‍යතාවයක් වූ පසුව යතුර ලබා ගැනීමේ දී ගැටළුකාරී තත්ත්වයක් පවතින බැවින්, මේ සඳහා සුදුසු පියවරක් ගත යුතු බව දන්වා සිටින ලදී. තවද, ක්‍රීඩාංගනයේ පිටුපස කාමරයේ ක්‍රීඩා උපකරණ කිහිපයක් තිබෙන බැවින්, ක්‍රීඩා කරන දරුවන් සඳහා ප්‍රයෝජනයක් ගත හැකි වන පරිදි වැඩපිළිවෙලක් සකස් කිරීම සුදුසු වන බවත් දන්වා සිටින ලදී.

ක්‍රීඩාංගනය වටා ඇති ගස්වල විශාල අතු ක්‍රීඩාංගනය දෙසට නැමී තිබීම නිසා, ක්‍රීඩා කිරීමේ දී අපහසුතාවලට මුහුණපෑමට සිදුවන බැවින්, මෙකී අතු ඉවත් කර දෙන ලෙසට ක්‍රීඩකයින් සහ ක්‍රීඩා නිලධාරී විසින් ඉල්ලීම් කළ බැවින්, එම අතු ඉවත් කර දීමට අවශ්‍ය කටයුතු සිදු කර දෙන මෙන් ඉල්ලා සිටිමි.

තවද දෙබරවැව ක්‍රීඩාංගනය සඳහා වැසිකිළියක අඩුවක් පවතින බැවින්, මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙසටත් දන්වා සිටින ලදී.

තම කොට්ඨාසයේ විථි පහන් කිහිපයක් නඩත්තු කර ගැනීමේ අවශ්‍යතාවය පවතින බවද දන්වා සිටින ලදී.

යෝධවැව උඩත්තෑවේ පාරම්පරිකව ගොවිතැන් කරනු ලබන ගොවි මහතුන්ගේ ඉඩම්ද අත්පත් කර ගනිමින් වාර්මාර්ග දෙපාර්තමේන්තුව විසින් රක්ෂිත ලකුණු කිරීමට කටයුතු කරනු ඇත. මේ සම්බන්ධව ප්‍රාදේශීය ලේකම්, වාර්මාර්ග ඉංජිනේරු සහ ගොවි සංවිධාන සමඟ සාකච්ඡා ද පවත්වා නිරීක්ෂණ කටයුතු සිදු කරන ලදී. එම නිසා පාරම්පරිකව ගොවිතැන් කරනු ලබන ගොවි ජනතාවගේ ගොවිතැන් රක්ෂිත ලකුණු කිරීමෙන් අහිමි වීමට ඉඩ ලබා නොදිය යුතු බව ප්‍රකාශ කරන ලදී.

එම ප්‍රදේශයේ පිහිටි වැව වටා රජයේ මුදලින් ඉදි කරන ලද මාර්ගයක් ද ඇති බැවින්, එම මාර්ගයට ඉහලින් රක්ෂිතය ලෙස ලකුණු කර ඇති ප්‍රදේශ නොසලකා, එම මාර්ගයෙන් පහල වැව තුළ ඇති ඉඩම් වැව් රක්ෂිත ලෙස සලකා අත්පත් කර ගැනීම සම්බන්ධව අපගේ කිසිදු විරෝධයක් නොමැති බවත්, පාරම්පරික ගොවි බිම් අහිමි වීමට ඉඩ නොදී වැව ආරක්ෂා වන පරිදි රක්ෂිත වෙන් කිරීම සුදුසු වන බව දන්වා සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු ප්‍රාදේශීය සභා සභික, ඒ.පී. ධම්මික මහතා</u>

අපට උරුම වැව් ආරක්ෂා කර ගැනීමට කටයුතු කළ යුතුය. 1987 දී ලබා දී ඇති ඔප්පු/ බලපත්‍ර තිබේ. මෙකී ඉඩම් පාරම්පරිකව වගා කරනු ලබන ඉඩම් වේ. වැව් පිටිය අත්පත් කර ගෙන ගොවිතැන් කටයුතු කර ඇති ඉඩම් ද තිබේ. එම නිසා මෙලෙස වැව් පිටිය තුළ අනවසරයෙන් අත්පත් කර ගෙන ඇති ඉඩම් ඉවත් කිරීමට කටයුතු කර, පාරම්පරික ලෙස ගොවිතැන් කටයුතු කරන ඉඩම් රක්ෂිත ලෙස නම් කිරීමට ඉඩ ලබා නොදිය යුතුය. එසේ වුවහොත් පාරම්පරික ජීවනෝපාය ලෙස ගොවිතැන් කරන ගොවි ජනතාව සිදු වන්නේ දැඩි අසාධාරණයකි. එම නිසා ඉදිරියේ දී අපගේ උරුමයන් වන වැව් ආරක්ෂා කර ගැනීමට වැව් රක්ෂිත අත්පත් කර ගැනීමට ඉඩ නොදිය යුතු බව දන්වා සිටින ලදී. එසේම පාරම්පරික ගොවි ජනතාවගේ ඉඩම් ආරක්ෂා කර ගැනීම සඳහා සභාවක් ලෙස අප සියලුම දෙනා මැදිහත් වී එම ගොවීන්ට සාධාරණයක් ඉටු කර දිය යුතු බව ප්‍රකාශ කර සිටින ලදී.

❖ <u>අදහස් දැක්වීම - ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා</u>

<u>දෙබරවැව ක්‍රීඩාංගන භූමියේ ඇති බොකුටු ගලවා ඉවත් කර, ක්‍රීඩාංගනය වටා ක්‍රීඩා කිරීමට බාධා වන ලෙස වැවී ඇති විශාල අතු ඉවත් කරලීමට තීරණය විය.</u>

<u>ප්‍රජා සංවර්ධන කමිටුව හරහා ක්‍රීඩාංගනයේ පිටුපස කාමරයෙහි ඇති ක්‍රීඩා උපකරණ පිළිබඳව සොයා බලා වාර්තාවක් ලබා ගෙන, ගරු සභික, ආර්.ඒ. ගයාන් සඳරුවන් මහතා, ලේකම්තුමිය, තාක්ෂණ සේවා නිලධාරී සමඟින් දිස්ත්‍රික් ක්‍රීඩා නිලධාරී ද සම්බන්ධ කර ගනිමින්, මෙකී ක්‍රීඩා උපකරණ ප්‍රයෝජනයට ගත හැකි වන පරිදි වැඩපිළිවෙලක් සාකච්ඡා කිරීම සුදුසු බවට තීරණය විය.</u>

<u>කොට්ඨාසයකට දින 02 ක් වන ලෙසට විථි පහන් නඩත්තු කිරීම සඳහා වැඩසටහන සකස් කළ යුතු බවටත් තීරණය විය.</u>

යෝධවැව උඩත්තෑවේ පාරම්පරිකව ගොවිතැන් කරනු ලබන ගොවි ජනතාවගේ ඉඩම් අත්පත් කර ගනිමින් වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් රක්ෂිත ලකුණු කිරීම සිදු කරන බැවින්, පාරම්පරිකව ගොවිතැන් කටයුතු කළ ගොවි ජනතාවගේ ඉඩම් අහිමි වීමට ඉඩ ලබා නොදෙන ලෙසට ඉල්ලා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ලිපියක් යොමු කිරීමට තීරණය විය.

ගොවි ජනතාව වසර ගණනාවක් තිස්සේ ජීවනෝපාය ලෙස ස්ථිරවම යෝධ වැව උඩත්තෑවේ ගොවිතැන් කටයුතු කරනු ලබයි. ගොවිතැන් කටයුතු කළ මුල් කාලයේ මෙලෙස රක්ෂිත ලකුණු නොකොට, වසර ගණනාවක් ගොවිතැන් කළ පසුව මෙලෙස නීතියක් ක්‍රියාත්මක කිරීම අසාධාරණ ක්‍රියාවක් බවත් සඳහන් කරන ලදී.

සිතුල්පව්ව විහාරස්ථායේ කඨින පිංකම සඳහා සහභාගී වූ පසුව, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපති චමල් රාජපක්ෂ මැතිතුමා සමඟ මා මේ පිළිබඳව සාකච්ඡා කරන ලදී. එහිදී ගරු එතුමන් විසින් ප්‍රකාශ කරන ලද්දේ මෙකී කරුණ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සාකච්ඡා කර, පාරම්පරික ගොවි ජනතාව සඳහා අසාධාරණයක් නොවන පරිදි රක්ෂිත සඳහා යම් සීමාවක් ලකුණු කිරීමට අදාළ ආයතනයන් සමඟ සාකච්ඡා කර තීරණයක් ලබා ගැනීම කටයුතු කළ හැකි බවයි. එම නිසා මේ සම්බන්ධයෙන් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත යොමු කිරීමට තීරණය විය.

එසේම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ගොවි බිම් සම්බන්ධ ගැටළුව ඉදිරිපත් කර, මේ සම්බන්ධයෙන් වැඩි දුර සාකච්ඡා කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම්, වාරිමාර්ග ඉංජිනේරු හා ගොවි සංවිධාන ගෙන්වා සාකච්ඡාවක් ලබා ගැනීම සුදුසු බවටත් තීරණය විය.

❖ **ගරු ප්‍රාදේශීය සභා සභික, වාලි ගුණරත්න මහතාගේ අදහස් දැක්වීම**

වැලිපොතේවල පාර සිට අන්දරගස්යාය දක්වා ප්‍රවාහනය කළ බස් රථය වැලිපොතේවල පාළම කැඩීයාමත් සමඟ ප්‍රවාහනයෙන් නතර වී තිබූ නිසා, මේ සම්බන්ධයෙන් මහා සභාවේ දී අදහස් දක්වා නැවත එම බස් රථය ප්‍රවාහනය එක් කර දෙන ලෙසට කරන ලද ඉල්ලීම අනුව, ලංකා ගමනා ගමන මණ්ඩලය විසින් එකී බස් රථය නැවත ප්‍රවාහනයට එක් කර ඇත. ජනතාවගේ ප්‍රවාහන පහසුම් ලබා ගැනීම සඳහා නැවත බස් රථය ධාවනය කර ගැනීමට සභාවේ සම්මත කර දීම සම්බන්ධයෙන් ගරු සභාපතිතුමාටත්, ගරු උප සභාපතිතුමාටත්, ගරු සභිකවරුන්ටත් ලේකම්තුමිය ඇතුළු නිලධාරී මණ්ඩලයටත් ස්තුතිය පුද කරන ලදී.

වැලිපොතේවල මාර්ගය ජයවීර නම් කොන්ත්‍රාත්කරු විසින් සිදු කර තිබුණද, මාර්ගය විධිමත්ව සකස් කර නොමැති බැවින්, මේ සම්බන්ධයෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත දන්වා යැවීම සුදුසු බව ප්‍රකාශ කරන ලදී. එසේම එකී කාපට් මාර්ගය කිසිදු අවසරයකින් තොරව ජල නල එලීම සඳහා මාර්ගය පළුදු කිරීම නිසා මාර්ගයට විශාල වශයෙන් හානි සිදු වේ. මේ සම්බන්ධයෙන් ද දන්වා යවන ලෙසට ඉල්ලා සිටින ලදී.

එසේම වැලිපොතේවල මාර්ගයේ බස් රථයට පවා ගමන් කිරීමට නොහැකි ලෙසට ගස් මාර්ගය දෙසට වැවී ඇති බැවින්, අදාළ ආයතනයන් වෙත දන්වා මාර්ග දෙපස සුද්ධ කර දෙන ලෙසටත් ඉල්ලා සිටින ලදී.

❖ **අදහස් දැක්වීම – ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා**

කිරින්ද, අන්දරගස්යාය, මාගම හරහා ප්‍රවාහනය කළ බස් රථය නැවත ධාවනයට එක් කිරීමට කටයුතු කිරීම සම්බන්ධව ස්තුතිය ලිපියක් ඩිපෝ අධිකාරීතුමා වෙත යොමු කරන ලෙසට ප්‍රජා සංවර්ධන නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.

<u>වැලිපොතේවල මාර්ගය සහ ඇල්ලගල දෙවනි පෙළ කාපට් ඇතිරූ මාර්ග 02 විධිමත් පරිදි සංවර්ධනය කර නොමැති බැවින්, එය පරීක්ෂා කර බලා එම මාර්ගයන් සඳහා රඳවා ගෙන ඇති මුදලින් හෝ මාර්ග 02 විධිමත්ම සංවර්ධනය කර දෙන ලෙසටත්, වැලිපොතේවල මාර්ග දෙසට වැවී ඇති අතු ඉති ඉවත් කර දෙන ලෙසටත් පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය වෙත ලිපියක් මගින් දන්වා යැවීමට තීරණය විය.</u>

❖ <u>ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතාගේ අදහස් දැක්වීම</u>

සභාවට අලුතින් පෙර පාසල් 10 ක් පවරා ගැනීමට තීරණය කර ඇති සේම, බල ප්‍රදේශයේ දුෂ්කර වසමක පෙර පාසලක් නොමැති ප්‍රදේශයක් තෝරා ගනිමින් අලුතින් පෙර පාසලක් ආරම්භ කිරීම සුදුසු බව ප්‍රකාශ කර සිටින ලදී.

මේ වන විට රන්මිණිතැන්න පුල්පල්ලම ප්‍රදේශයේ පෙර පාසලක් ආරම්භ කිරීම සඳහා ඊට අවශ්‍ය සංවර්ධන කටයුතු සිදු කරමින් පවතී. අලුතින් සකස් කරන ලද එම පෙර පාසලට අදාළ සංවර්ධන කටයුතුවලදී ගරු උප සභාපතිතුමා දැඩි මැදිහත්වීමක් හා දායකත්වයක් දක්වා තිබීම පිළිබඳ එතුමන්ට ස්තුතිය පුද කළ යුතුය.

එසේම රන්මිණිතැන්න වැනි දුර ප්‍රදේශයක සිටින දරුවන් පෙර පාසල් සඳහා තිස්සමහාරාම දෙබරවැව වැනි ප්‍රදේශවලට යාමට සිදු වන නිසා, රන්මිණිතැන්න ප්‍රදේශයේ අලුතින් පෙර පාසලක් ආරම්භ කිරීම ඉතාමත් අත්‍යාවශ්‍යම කරුණක් ලෙස පෙන්වා දිය හැකිය. රන්මිණිතැන්න පෙර පාසල ආරම්භ කරනවා සේම, සභාවට පවරා ගැනීමට නියමිත පෙර පාසල් 10 න් 02 ක් හෝ සභාවට පවරා ගැනීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා ගැනීමට කාරුණික සහයෝගය ලබා දෙන ලෙසට ගරු ආණ්ඩුකාරතුමා වෙත ලිපියක් මගින් දන්වා යැවීම සුදුසු බවටත් තීරණය විය.

එසේම රන්මිණිතැන්න පුල්පල්ලම පෙර පාසලෙහි සංවර්ධන කටයුතු කඩිනමින් සිදු කර, 2023 වසරේ පෙර පාසල් සඳහා දරුවන් බඳවා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙසටත්, අලුතින් ඒ සඳහා ගුරුවරුන් බඳවා ගත නොහැකි නිසා, දැනට අප සභාවට අයත් පෙර පාසලකින් ගුරුවරියක් ඒ සඳහා යෙදවීමට කටයුතු කරන ලෙසටත් ප්‍රජා සංවර්ධන විෂය නිලධාරී වෙත උපදෙස් ලබා දෙන ලදී.

මන්ත්‍රී කොට්ඨාසයන්වලින් සභාවට පවරා ගැනීම සඳහා පෙර පාසලක් තෝරා ගැනීමේ දී දුෂ්කර තත්ත්වයේ පවතින වසමක තිබෙන පෙර පාසල් තෝරා ගැනීමට ප්‍රමුඛතාවය දී කටයුතු සිදු කරන ලෙසට ගරු සභිකයින් වෙත දන්වා සිටින ලදී.

එසේම බල ප්‍රදේශයේ සෑම කොට්ඨාසයකම සුසාන භූමි පවතින බැවින්, යම් කොට්ඨාසයක පුද්ගලයෙකු මිය ගිය පසුව, එකී මෘත දේහය අදාළ කොට්ඨාසයේ පවතින සුසාන භූමියක හැර වෙනත් කොට්ඨාසයක සුසාන භූමියක මිහිදන් නොකරන ලෙසට අදාළ කොට්ඨාසවල ජනතාව දැනුවත් කරන ලෙස ගරු සභිකයින් වෙත දන්වා සිටින ලදී. තවද සුවිශේෂී කරුණක් මත (උසාවි නඩුවක් යන) පවතින මෘත දේහයක් හැර (අදාළ වසමෙන් පිටත) වෙනත් කිසිදු මෘත දේහයක් අකුරුගොඩ, මහසෙන්පුර, දෙබරවැව යන සුසාන භූමිවල මිහිදන් කිරීමට අවස්ථාව ලබා දිය නොහැකි බවත් ප්‍රකාශ කර සිටින ලදී.

සභාව සතු කුට්ටිගල් සැකසීමේ යන්ත්‍රය ගල් ක්‍රෂරය අසාර්ථක ව්‍යාපෘතියක් නිසා එකී යන්ත්‍රය වෙන්දේසි කිරීම සුදුසු බව දන්වා සිටින ලදී. එසේම ජනතා විමුක්ති පෙරමුණ කාලයේ කසළ කළමනාකරණ ව්‍යාපෘතිය ද අසාර්ථක වී තිබුණද, 2011 අප කාලය තුළ එය සාර්ථක ව්‍යාපෘතියක් ලෙස ප්‍රතිසංස්කරණය කරමින් මේ දක්වා සිදු කර ගෙන යනු ලබයි. තවද, ජනතා විමුක්ති පෙරමුණ කාලයේම ඉදි කරන ලද ආදාහනාගාරයද අසාර්ථක වීමට ඉඩනොදී ජනතාවට ගැටළුවක් වී තිබූ ආදාහනාගාරයේ චිමිනිය උසින් වැඩි කර එය ද සාර්ථකව සකස් කර මේ වන විට පවත්වාගෙන යනු ලබන බව දන්වා සිටින ලදී.

අප පාලන කාලය තුළ සිදු කරන ලද ව්‍යාපෘති හා නඩත්තු කටයුතු පිළිබද වාර්තාවක් සෑම විෂයක් වෙතින්ම ලබා ගෙන ලබන මහා සභාවට ඉදිරිපත් කරන ලෙසට උපදෙස් ලබා දෙන ලදී.

2021 වර්ෂය සඳහා ද තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව ගිණුම්කරණ මූලා ධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණව කටයුතු කර ඇති බවට විගණන මතය ලැබී ඇත. අප පාලන කාලය තුළ මෙලෙස විගණන මතයක් ලැබීම පිළිබද අප සියලුම දෙනාට සතුටටත් අභිමානයටත් කරුණකි. එලෙසට සත්‍ය හා සාධාරණව කටයුතු කර ඇති බවට වූ විගණන මතය ලබා ගැනීමට හැකි වූයේ ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු සභික මඩුල්ලත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයත් ලබා දුන් සහයෝගයත් කැපවීමත් නිසාවෙන්, එම සියලුම දෙනාට ස්තූතිය පුද කරන ලදී. පසුගිය වසර තුළදී සේම ඉදිරි කාලය තුලත් අප සිදු කරන සෑම කටයුත්තක්ම සත්‍ය සාධාරණව හා නීත්‍යානුකූලව සිදු කරන බව සහතික විය හැකි බවත් ප්‍රකාශ කරන ලදී.

මේ දිනවල පවතින ඉන්ධන අර්බුදකාරී තත්ත්වයත් සමඟ බල ප්‍රදේශයේ සියලුම සුසාන භූමි සුද්ධ කිරීමට වැඩපිළිවෙලක් යොදා ගත නොහැකි බැවින්, ප්‍රධාන සුසාන භූමි 04 සුද්ධ පවිත්‍ර කිරීම සඳහා වැඩසටහනක් සකස් කර, අනෙකුත් සුසාන භූමි ගමේ ශ්‍රම දායකත්වය ලබා ගනිමින් සුද්ධ පවිත්‍ර කර ගන්නා ලෙසට සියලුම ගරු සභිකවරුන්ගෙන් ඉල්ලා සිටින ලදී.

අද දින මහා සභාව සාර්ථකව පවත්වාගෙන යාමට සහාය ලබා දුන් ගරු උප සභාපතිතුමා, ගරු ප්‍රාදේශීය සභා සභිකයින්ට හා ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයේ නිලධාරී මහත්මියටත්, මාධ්‍යවේදී ප්‍රේමදාස මහතාටත් ගරු සභාපති, ඩබ්ලිව්.ජී. උපුල් මහතා විසින් ස්තූතිය පුද කිරීමෙන් අනතුරුව ප.ව. 02.00 ට පමණ මහා සභාවේ කටයුතු අවසන් කරන ලදී.

2022 වර්ෂයේ නොවැම්බර් මාසයට පැවැත්වීමට නියමිත මාසික මහා සභාව, 2022 වර්ෂයේ මාසික මහා සභා රැස්වීම් කාල සටහනේ සඳහන් පරිදි 2022.11.17 වන දින පැවැත්වීමට කටයුතු කරන බව ගරු සභාපතිතුමා විසින් දන්වා සිටින ලදී.

වාර්තා කළේ - ඩී. රුවිනා දීපානි,
ලේකම්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

සභාපති,
ඩබ්ලිව්.ජී. උපුල්,
තිස්සමහාරාම ප්‍රාදේශීය සභාව.

2022.10.18 දින තිස්සමහාරාම ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී.